වාර්ෂික වාර්තාව

2013

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

ගොඩනැගිලි අංක 05, 01 වන මහල, බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07.
දුරකථන: +94(0)11-2677445 ෆැක්ස්: +94(0) 11-2682534
Email: info@energy.gov.lk Web: www.energy.gov.lk

සභාපති තුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය දිගු ගමනක අරුණළු දකිමින් සිටින මෙවන් මොහොතක එහි සභාපති වරයා වශයෙන් 2013 වාර්ෂික වාර්තාවට මෙවන් සටහනක් තබන්නේ ඉමහත් ආඩම්බරයකි.

ශක්ති සම්පත් ක්‍රමිකව ක්ෂයවෙමින් පවතින වර්තමාන ලෝකය, එහි සුරක්ෂිතභාවය වෙනුවෙන් දැඩි අවධානයකින් පසුවන්නේ එය මතම සියල්ල තීරණය වන තරමටම එහි වැදගත්කම පසක්වී ඇති නිසාවෙනි. ශ්‍රී ලංකාව තුළ බලශක්ති උත්පාදනය ජල විදුලිය මතින් ගමන් ඇරඹුවද මිනිස් අවශ්‍යතාවයන් හි අසීමිත බව සහ කාර්මික, තාක්ෂණික අංශයන් හි අනවරත දියුණුව තාප ශක්තියේ පිහිට පැතීම දක්වා මිනිසා දිශානුගත කර ඇත. අපේම වූ තෙල් හෝ ගල් අඟුරු සම්පත් නොමැති ශ්‍රී ලංකාව තම ශක්ති සම්පත් උත්පාදය කර ගැනීමේ දී බොර තෙල් ආනයනය මත යැපීමට සිදු කරවන මෙම තත්වය සුළුකොට තැකිය නොහැකිය. මෙහි අතුරු ඵලයක් ලෙසින් අනාගත ආර්ථික අවපාතයක පෙරනිමිති පහළ වෙමින් පවතින්නේ ඉන්ධන සඳහා වන ගෝලීය ඉල්ලුම සීඝ්‍රයෙන් ඉහළ යන නිසාවෙනි.

මෙම ඛේදනීය විපර්යාශය මැනවින් අවබෝධ කර ගන්නා වගකිව යුත්තන් පවත්නා අර්බුදකාරී පසුබිමට තිරසාර විසඳුමක් සෙවීමේ පරම අභිලාශය පෙරදැරිව 2007 අංක 35 දරණ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති පනත මගින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ස්ථාපිත කරන්නේ බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවකයන දැක්මකින් යුතුවයි. දිවයිනෙහි පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය සහ බලශක්ති සංරක්ෂණය ඉහළ නැංවීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය මෙන්ම ක්‍රියාවට නැංවීම සිදුකරන කේන්ද්‍රීය ආයතනය මෙය බවට පත් වන්නේ විශේෂිත වූ බලතලද පනත මගින් උරුම කර ගනිමිනි.

අධිකාරියේ ප්‍රධාන අරමුණ වන්නේ පුනර්ජනනීය බලශක්තිය, බලශක්ති කාර්යක්ෂමතාව හා ඵලදායී බලශක්ති සැපයීම සඳහා පහසුකම් සැපයීම මගින් බලශක්ති සංරක්ෂණය යථාර්තයක් බවට පත්කර ගැනීමට රජයට සහය දැක්වීමයි. ජාතික ප්‍රතිපත්ති සම්පාදනයෙහි මෙම සංකල්පයේ ඇති වැදගත්කම අවධාරණය කරමින් මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළින් වර්ෂ 2020 වන විට නව පුනර්ජනනීය බලශක්තිය මගින් ජනනය කරන ලද විදුලියෙන් ජාල විදුලිය සඳහා දායකත්වය 20% කින් සහ සත්‍ය පාරිභෝජනයට බලශක්තිය ඉතිරි කිරීමේ නැඹුරු තාවය 8.7% කින් ඉහළ නැංවීමටත් ඉලක්ක කර ඇත. මෙම ඉලක්ක සාක්ෂාත් කර ගැනීම, දිවයිනෙහි පවතින ප්‍රමාණවත් පාරම්පරික සම්පත් භාවිතයට ගැනීම ප්‍රවර්ධනය කිරීමට සහ බලශක්ති ක්ෂේත්‍රය බලශක්ති කාර්යක්ෂම සහ පරිසර හිතකාමී බවට පත් කිරීමට හේතුවක් ද වනු ඇත.
ශ්‍රී ලංකාව තුළ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වශයෙන් ගත් විට විශේෂ අවධානයකට ලක්ව ඇත්තේ කුඩා ජල විදුලි, සුළං සහ ජෛව ස්කන්ධ යන ඒවාය. මෙසේ සිදුව ඇත්තේ ශ්‍රී ලංකා වැනි රටක පහසුවෙන් නිෂ්පාදනය කළ හැක්කේ එම ශක්ති ප්‍රභවයන් නිසාවෙනි.

බලශක්ති නැණසක් සතු මතු පරපුරක් ගොඩනැගීමේ කාර්ය පිළිබඳව මෙහිදී නොකියාම බැරිය. මෙහිදී අප වඩාත් විශ්වාසය තබා ඇත්තේ දේශයේ ළමා පරපුර පිළිබඳවයි. හෙට දින ලොව දිනන දේශයේ දූ පුතුන් බලශක්ති සංරක්ෂණය හා එහි වැදගත්කම පිළිබඳව දැනුමින් සන්නද්ධ වන්නේ නම් අපගේ ජාතික කර්තව්‍ය සාර්ථක කර ගැනීමේ සිහිනය යථාර්තයක් වීම අත ළඟම බැව් පසක්වේ. ජාතික අධ්‍යාපන ආයතනය සමග එක්ව පාසල් විද්‍යා විෂය මාලාවට බලශක්තිය හා බලශක්ති සංරක්ෂණ විෂය ඇතුළත් කිරීමට කටයුතු යොදා ඇත්තේ එම නිසාවෙන්මය. එතකින් නොනැනවතුන අප පෙර පාසල් ගුරුවරුන්ගේ විඥානයට බලශක්ති සංරක්ෂණය ඇතුළත් කිරීම උදෙසා නිර්මාණශීලී වැඩසටහනක් ද දියත් කර ඇත. ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය හා එක්ව බාලදක්ෂ ප්‍රවීණතා විෂය නිර්දේශයට බලශක්ති සංරක්ෂණ විෂය ඇතුළත් කිරීම හා බාලදක්ෂ ප්‍රවීණතා ලාංඡනය හඳුන්වා දීම සිදු කරනු ලැබුවේ ද අපගේ දේශයේ අනාගත පරපුර

බලශක්ති සංරක්ෂණයට යොමුකර ගැනීමේ ව්‍යායාමය ශක්තිමත් කර ගැනීම සඳහාය.

බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක් කරා යන ගමනේ නියමුවන් ලෙසින් නිරන්තරයෙන් පෙළ ගැසී සිටින ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ ජනරාල් වරයා සහ කාර්යමණ්ඩලය අප යන මේ ගමනට ලබා දෙන සහයෝගය සහ දායකත්වය සිහි කරන්නේ කෘතඥතා පූර්වකවය.

ස්තූතියි

සභාපති
ප්‍රසාද් ගල්හේන

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවුඩය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (ශ්‍රී.ල.සු.බ.අ) වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය වෙනුවෙන් මෙම සටහන මා තබන්නේ මහත් වූ සතුටිනි. 2013 වර්ෂයේ ශ්‍රීලසුබඅ හි ප්‍රධාන ජයග්‍රහණ පිළිබව අගයකිරීම සඳහා එමගින් විශේෂිත අවස්ථාවක් ලබා දෙයි.

2013 වර්ෂය තුළදී ශ්‍රී.ල.සු.බ.අ එහි අරමුණු ඔස්සේ පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කිරීම මඟින් පුනර්ජනනීය බලශක්ති, බලශක්ති කාර්යක්ෂමතා සහ දැනුම කළමනාකරණය වැනි පුළුල් ආංශික ක්ෂේත්‍රයන්හි මැදිහත්වීම් තුළින් බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක් සාක්ෂාත් කර ගැනීම සඳහා ජනතාවට මඟපෙන්වා ඇත. කැපවූ කාර්ය මණ්ඩල කණ්ඩායමක වෙහෙස නොබලා ක්‍රියා කිරීම සමඟින් එහි සම්පත් උපරිම වශයෙන් පරිභෝජනය කරමින් මෙම සියළු ක්ෂේත්‍රයන්හි සැළකිය යුතු ප්‍රවණතා සාක්ෂාත් කර ගැනීමට ශ්‍රීලසුබඅ සමත් වී ඇත.

2013 වර්ෂයේදී ශ්‍රී.ල.සු.බ.අ පරිසර අමාත්‍යාංශය යටතට පත් කිරීමත් සමඟම වඩාත් ක්‍රියාශීලි බවක් සහ බලශක්ති ක්ෂේත්‍රයේ වැඩසටහන් සකස් කිරීමේදී සහ ක්‍රියාවට නැංවීමේදී සමාජ හා පරිසර තිරසර අංශයන් සඳහා වැඩි අවධානයක් යොමු කිරීම සඳහා අනුබලය ලබා දීමක් සිදු විය. මෙමඟින් ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලිය සමඟ සම්බන්ධව සිටින වෙනත් පාලන අධිකාරියන් සහ රේඛීය නියෝජිතායතන සමඟ සම්බන්ධතා ශක්තිමත් කර ගැනීම සඳහා ශ්‍රී.ල.සු.බ.අ ට අවස්ථාව හිමි වීමෙන් එක් ස්ථානයකින් සියළු සේවාවන් ලබා ගැනීමේ සංකල්පය තහවුරු වී ඇත.

2013 වර්ෂය තුළදී, ජාල ධාරිතාවය ඉහළ නැංවීම සඳහා සම්පත් සිතියම්ගත කිරීම සහ විශේෂයෙන් කුඩා ජල විදුලි, සුළං, සූර්ය සහ ජෛව ස්කන්ධ සම්බන්ධිත SPP ව්‍යාපෘති ප්‍රවණතා තුළින් ශ්‍රී.ල.සු.බ.අ නව පුනර්ජනනීය බලශක්තියෙහි (NRE) සැළකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. 2012 වර්ෂයේ සිට එක් කිරීමේ අය ක්‍රමයක් නොමැති වීම සහ ජාල සම්බන්ධතාවය නොමැති වීමෙන් පැන නැගි අභියෝගයන් නොසළකමින්, මුළු ස්ථාපිත ධාරිතාවය පිළිවෙළින් මෙ.වො. 26.5, මෙ.වො. 5.0 සහ මෙ.වො. 4.8ක් වන කුඩා ජල විදුලි බලාගාර 16ක්, එක් ජෛව ස්කන්ධ බලාගාරයක් සහ එක් සුළං බලාගාරයක් 2013 වර්ෂයේදී කොමිෂන් කර ඇත. වර්ෂ 2015 දී සාක්ෂාත් කර ගැනීමට ඉලක්ක කරන ලද 10% ක ඉලක්කය, ඉලක්කගත කාලයට පෙර අත්පත් කර ගනිමින් ජාල විදුලි උත්පාදනයෙන් 9.74%ක් සඳහා හේතු වන නව පුනර්ජනනීය බලශක්ති මුළු ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 351.6 ක් සහ ගි.වො.පැ. 1168.7ක වාර්ෂික බලශක්ති උත්පාදනයක් මෙමඟින් ලබාගෙන ඇත. SPP සූර්ය ධාරිතාවය එක් කිරීමක් නොමැති වුවද 2013 වර්ෂයේදී මෙ.වො. 3ක සූර්ය ජාල මානන ව්‍යාපෘති කොමිෂන් කර ඇත. ජාතික ජාලය පුළුල් වීමත් සමඟින් ජාලයෙන් පිටත විදුලි ක්ෂේත්‍රයෙහි වැදගත්කම තවදුරටත් අඩුවෙමින් පැවතියද, පවතින ක්ෂුද්‍ර ජල විදුලි බලාගාරයන්හි අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා ශ්‍රී.ල.සු.බ.අ අඛණ්ඩව සහාය ලබා දී ඇත.

ශ්‍රී.ල.සු.බ.අ විසින් කොමිෂන් කරන ලද නව පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිතා කරමින් ආරම්භයේ සිට මුළු ධාරිතාවය මෙ.වො.243ක් සඳහා දායක වෙමින් 2011 වර්ෂයේදී පමණක් මෙ.වො. 25.61ක විදුලි බලාගාර ජාතික ජාලයට සම්බන්ධ කිරීමට හැකි වී ඇත. ගෘහස්ථ, කර්මාන්ත සහ වාණිජ අංශයන්හි බලශක්ති කාර්යක්ෂමතා ක්‍රියාමාර්ග තුළින් 2011 වර්ෂයේදී ගි.වො.පැ. 448.3ක සැළකිය යුතු බලශක්ති ඉතිරියක් සාක්ෂාත් කර ගැනීමට ශ්‍රී.ල.සු.බ.අ සමත් විය. මෙය 2011 වර්ෂයේදී දිවයිනෙහි මුළු විදුලි පරිභෝජනයෙන් 4.1%ට සමාන වේ. තවද, ඉන්ධන මාරු කිරීමේ වැඩසටහන් තුළින් තෙල් ලීටර් මිලියන 715ක, පෙට්‍රෝලියම් වායු ටොන් 328.7ක සහ දැව ඉන්ධන ටොන් 476.3ක කැපී පෙනෙන ඉතිරියක් 2011 වර්ෂයේදී සාක්ෂාත් කර ගෙන ඇත. ජාතික ජාලය පුළුල් වීමත් සමඟම ජාලයෙන් පිටත විදුලිබල අංශයෙහි වැදගත්කම අඩු වෙමින්

පැවතියද, ශ්‍රී.ල.සු.බ.අ ක්‍රියාකාරිව පවතින ක්ෂුද්‍ර ජල විදුලි බලාගාරයන්හි අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා ශ්‍රී.ල.සු.බ.අ අඛණ්ඩව සහාය ලබා දෙමින් සිටී.

සියළු පාරිභෝගික බලශක්ති අංශයන් ඉලක්කගත කරමින් බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම් සහ සංරක්ෂණය සඳහා 2013 වර්ෂය තුළදීද මැදිහත්වීම් කිහිපයක් සිදු කර ඇත. 2011 වර්ෂයේ ප්‍රකාශයට පත් කරන ලද බලශක්ති කළමනාකරුවන් සහ බලශක්ති විගණකවරුන් බලාත්මක කිරීමේ නියාමන්ට සහ ජාතික බලශක්ති කාර්යක්ෂමතා සැලැස්මට (EnMAP) අනුකූලව කර්මාන්ත සහ වාණිජ අංශයන්හි විශේෂිත උප-අංශයන් සඳහා පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. සම්මන්ත්‍රණ, ජනමාධ්‍ය මෙහෙයුම් සහ මුද්‍රිත ද්‍රව්‍ය වැනි දැනුම් කළමනාකරණ ක්‍රියාකාරකම් සමූහයක් තුළින් ගෘහස්ථ අංශයේ බලශක්ති සංරක්ෂණය සාක්ෂාත් කර ගන්නා ලදී. මෙම මැදිහත්වීම් තුළින් 2013 වර්ෂයේදී ගෘහස්ථ, කර්මාන්ත සහ වාණිජ අංශයන්හි ගි.වො.පැ. 22.6ක සැළකිය යුතු ඉතිරියක් සාක්ෂාත් කර ගැනීමට ශ්‍රී.ල.සු.බ.අ සමත් වී ඇත. එයට අමතරව ඉන්ධන මාරුකිරීමේ වැඩසටහන් තුළින් තෙල් ලීටර් මිලියන 19.6ක සහ දැව ඉන්ධන ටොන් 200ක සැළකිය යුතු ඉතිරියක්ද සාක්ෂාත් කර ගෙන ඇත.

2013 වර්ෂයේදී සිදු කරන ලද තවත් වැදගත් ක්‍රියාකාරකමක් වන්නේ 2011 වර්යේදී දියත් කරන ලද ප්‍රවාහන අංශයෙහි බලශක්ති කළමනාකරණ වැඩසටහනයි. මෙම වර්ෂයේ වැඩසටහන සැසිවාර තුනකින් එනම්, සුපිරිසිදු ඉන්ධන සහ වාහන මාර්ග සිතියම පිළිබඳ කතිකාවත, ශ්‍රී ලංකාව තුළ එලවුම් චක්‍රයක් සකස් කිරීමේ පිළිබඳ පුහුණු වැඩසටහන, බලශක්ති කාර්යක්ෂම සහ පරිසර තිරසර ප්‍රවාහන පද්ධතියක් (E3ST) සම්පාදනය කිරීම සඳහා සාකච්ඡා වැඩමුළුවකින් සමන්විත විය.

බලශක්ති සහ සම්බන්ධිත අභියෝගයන් තවමත් ඇතිවෙමින් පවතින අවස්ථාවක සහ ඒවා දිවයිනෙහි අනාගත සංවර්ධන ක්‍රියාමාර්ගයන්හි මෙහෙයුම් සාධකය වන අවස්ථාවක අනාගත වර්ෂයන් ශ්‍රී.ල.සු.බ.අ ට වඩාත් වගකීම් සහිත වර්ෂයන් වනු ඇත. ශ්‍රී.ල.සු.බ.අ විසින් ආරම්භ කරන ලද වැඩසටහන් සහ සකස් කරන ලද ක්‍රියාකාරි සැලසුම්, බලශක්ති කාර්යක්ෂමතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා මඟ පෙන්වනු ඇතැයිද එමඟින් දිවයිනෙහි ආර්ථික සංවර්ධනය සඳහා දායකත්වය දක්වනු ඇතැයිද මම විශ්වාස කරමි.

ආචාර්ය තුසිත සුගතපාල

අධ්‍යක්ෂ ජනරාල්

අපගේ දැක්ම

බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක්

අපගේ මෙහෙවර

ගවේෂණය, සුසාධනය, පහසුකම් සැපයීම, පර්යේෂණ සහ සංවර්ධන මෙන්ම දැනුම් කළමනාකරණය තුලින් දේශීය බලශක්ති ප්‍රභව සංවර්ධනයට සහ බලශක්ති සම්පත් ඉතිරි කරගැනීමටත් සිදු කෙරෙන්නා වූ ජාතික ව්‍යායාමයට මඟ පෙන්වීම සහ එමගින් ස්වාභාවික, මානව සහ ආර්ථික සම්පත් සුරැකිමින් ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීමට මග සැලසීම.

<u>අධ්‍යක්ෂ මණ්ඩලය - 2013</u>

සභාපති
ප්‍රසාද් ගල්හේන මහතා

<u>සාමාජිකයින්</u>

ධාරා විජේතිලක මහත්මිය
ලේකම්
විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

අබ්දුල් මජීඩ් මහතා
අතිරේක ලේකම් (සංවර්ධන)
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය

එම්. ඒ. තාජුඩීන් මහතා
අතිරේක ලේකම්
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

තනුජා මුරුගේෂන් මහත්මිය
අතිරේක ලේකම් (පාලන)
ඉඩම් හි ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

ඒ. එල්. ඒ. අශෝක සිරිවර්ධන මහතා
අතිරේක ලේකම් (පාලන)
කෘෂිකර්ම අමාත්‍යාංශය

විමල් ජයවර්ධන මහතා
අතිරේක ලේකම් (පාලන)
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

එන්. කේ. ජී. කේ. නැම්මවත්ත
අතිරේක ලේකම් (ජාතික සම්පත්)
විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය

යූ. පී. වික්‍රමරත්න මහතා
අතිරේක ලේකම් (තාක්ෂණික)
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය

ජේ. ජී. එල්. එස්. ජයවර්ධන මහතා
අධ්‍යක්ෂ
විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය

එස්. එස්. මුදලිගේ මහතා
අධ්‍යක්ෂ (සංවර්ධ හා ජාතික සැලසුම්)
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

ඒ. ඩබ්. එම්. සරත්චන්ද්‍ර මහතා
අධ්‍යක්ෂ (ව්‍යාපෘති, තාක්ෂණික)
ප්‍රවාහන අමාත්‍යාංශය

දමිත කුමාරසිංහ මහතා
අධ්‍යක්ෂ ජනරාල්
මහජන උපයෝගීතා කොමිසන් සභාව

අරෝස් සන්දීප විජේසිංහ මහතා
ප්‍රධාන විධායක/සභාපති
ඕමිනිප්‍රො ඉන්ඩස්ට්‍රීස් (පුද්.) සමාගම

රුවන් විරාජ් වෛද්‍යරත්න මහතා
කළමනාකරණ අධ්‍යක්ෂ
හේලීස් ඇඩ්වාන්ටීස් ලිමිටඩ්

අශෝක අබේගුණවර්ධන මහතා
විධායක අධ්‍යක්ෂ
බලශක්ති සංශදය

සී. මහේෂ් එදිරිසිංහ මහතා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
කොළඹ විශ්වවිද්‍යාලය

විනෝද් සමරවික්‍රම මහතා
අධ්‍යක්ෂ (විකුණුම්)
එරික්ෂන් ටෙලිකොමිනිකේෂන් ලංකා (පුද්.) සමාගම

ඩී. ඩී. ආනනන්ද නාමල් මහතා
සභාපති
ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය

හාතිය රණතුංග මහතා
සභාපති
කුඩා ජල විදුලිබලාගාර සංවර්ධකයන්ගේ සංගමය
එකෝ පවර් (පුද්.) සමාගම

විගණන සහ කළමනාකරණ කමිටු සාමාජිකයින් – 2013

සභාපති
එස්.එස්. මුදලිගේ මහතා
අධ්‍යක්ෂ (ජාතික ක්‍රසම්පාදන දෙපාර්තමේන්තුව)
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

සාමාජික
ගාමිණී ගමගේ මහතා
අතිරේක ලේකම් (පාරිසරික ප්‍රතිපත්ති)
පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

සාමාජික
සුලක්ෂණ ජයවර්ධන මහතා
අධ්‍යක්ෂ (සැලසුම් සහ ප්‍රගති අධීක්ෂණ)
විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය

නිරීක්ෂක
ආර්.එම් රත්නායක මහතා
විගණන අධිකාරි
විගණකාධිපති දෙපාර්තමේන්තුව

අපගේ කාර්ය මණ්ඩල සංයුතිය – 2013

මුළු කාර්යමණ්ඩල සංඛ්‍යාව 91 දෙනෙකුගෙන් සමන්විත වන අප ආයතනය සාපේක්ෂව කුඩා ආයතනයකි.
අපගේ කාර්ය මණ්ඩල සංයුතිය පහත දක්වා ඇත.



<u>ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ කාර්ය සාධනය(ශ්‍රීලසුබඅ)</u>

ශ්‍රී ලංකා ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ගයන් ජාතික සහ පුද්ගල දෘෂ්ටිකෝණයෙන් බලශක්ති ආරක්ෂාව මත ශක්තිමත් අවධාරණයක් ඇති කරනු ලැබේ. විශ්වසනීය,දැරීමට හැකි, සහ පිරිසිදු බලශක්තිය සියලු අවස්ථාවලදී සියලු ජනතාවට ලබා ගැනීමට හැකි තත්ත්වයක් ප්‍රතිපත්තිය මගින් අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (ශ්‍රීලසුබඅ) දිවයින තුළ සියලු ආකාරයේ පුනර්ජනනීය බලශක්ති වැඩි වශයෙන් යොදා ගැනීම සහ තිරසර භාවිතය ප්‍රවර්ධනය කරනු ලබන කේන්ද්‍රීය රාජ්‍ය ආයතනයයි. විශේෂයෙන් දැරිය හැකි මිලකට සමස්ත ශ්‍රී ලංකාවටම අඛණ්ඩ විදුලි සැපයුමක් ලබාදීම සම්බන්ධයෙන් සහ තාප විදුලි බලය උත්පාදනය සඳහා අපනයන කරනු ලබන පොසිල ඉන්ධන මත විශාල වශයෙන් රඳා පැවතීම හේතුවෙන් ආර්ථිකය මත ඇතිකර දැඩි අහිතකර බලපෑම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය වර්තමානයේදී අභියෝග රැසකට මුහුණු දී සිටී. මෙම තත්ත්වය වැළැක්වීම සඳහා රජය විසින් පහත අරමුණු පිහිටුවා ඇත;

- ආනයනික පොසිල සඳහා විකල්පයක් ලෙස වර්ෂ 2020 වනවිට නව පුනර්ජනනීය ඉන්ධන භාවිතයෙන් ජාල විදුලියෙන් 20%ක් උත්පාදනය කිරීම.
- බලශක්ති සංරක්ෂණ ක්‍රියාමාර්ග ක්‍රයාවට නැංවීම තුළින් වර්ෂ 2020 වනවිට මුළු බලශක්ති පරිභෝජනයෙන් 8.7% ක් අඩු කිරීම.

2013-2014 වර්ෂයේදී මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රීලසුබඅ විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගවල සාරාංශයක් පහත දක්වා ඇත

සාරාංශය:

- මෙ.වො. 217.685ක මුළු නව පුනර්ජනනීය බලශක්ති උත්පාදනයක් සඳහා හේතු වන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති 93ක් අනුමත කර ඇත.
- ජාලයෙන් පිටත විදුලිය ලබා දීමේ විකල්පය භාවිතා කරමින් ග්‍රාමීය ප්‍රජාව සඳහා ජාලයෙන් පිටත විදුලිය ලබා දීමේ විකල්පය භාවිතා කරමින් 'ලංකාගම' සහ 'සුනිත්‍යාලෝකය' ව්‍යාපෘති ක්‍රියාවට නංවන ලදී.
- **ආසියානු සංවර්ධන බැංකු (ADB)ආධාර ලැබූ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති දෙකක් ක්‍රියාවට නැංවීම**
  - වතු ක්ෂුද්‍ර-ජල විදුලි පුනරුත්ථාපන සහ නැවත බලගැන්වීමේ නියමු ව්‍යාපෘතිය; ව්‍යාපෘතියේ සංවර්ධන සංඝටකය වන්නේ ජාලය සඳහා මෙ.වො. 1.3 ක් ලබා දෙමින් ක්ෂුද්‍ර ජල විදුලි ව්‍යාපෘති 19ක් පමණ සම්බන්ධ කිරිමයි.
  - සූර්ය පියසි විදුලි උත්පාදනය නියමු ව්‍යාපෘතිය; ව්‍යාපෘතියේ සංවර්ධන සංඝටකය වන්නේ මොරටුව විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය සහ රුහුණු විශ්වවිද්‍යාලය සූර්ය පියසි විදුලි උත්පාදන උප-ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ කොළඹ, මහනුවර සහ යාපනය නගර වටා පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් සූර්ය පියසි උප ව්‍යාපෘති (දළ වශයෙන් කි.වො.800) ක්‍රියාත්මකකිරීම.
- කර්මාන්ත සහ වාණිජ ක්ෂේත්‍රයන්හි බලශක්ති කාර්යක්ෂමතා ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම තුළින් මෙ.වො.පැ. 1,724 ක් ඉතිරි කිරීම.
- ප්‍රධාන වශයෙන් ඉන්ධන මාරුකිරීමේ මුලපිරීම් තුළින් ඩීසල් ලීටර 60,223ක් සහ උඳුන් තෙල් ලීටර 7,376ක් ඉතිරි කිරීම.
- දළ වශයෙන් ගි.වො.පැ. 22 ක වාර්ෂික ඉතිරියක් ඇති කිරීමට හේතු වන විදුලි පංකා ලේබල් කිරීමේ රෙගුලාසි 2013 ජනවාරි ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කර ඇත..
- විදුලි පංකා ලේබල් කිරීමේ පරීක්ෂණ විද්‍යාගාරයක් මොරටුව විශ්ව විද්‍යාලයේ ස්ථාපිත කර ඇත.

<u>ප්‍රගතියේ සාරාංශය (2013 ජනවාරි - 2013 දෙසැම්බර්)</u>

<table>
<tr><th>අංකය</th><th>ක්‍රියාකාරකම්වල විස්තරය (ප්‍රධාන සාක්ෂාත් කිරීම්)</th></tr>
<tr><td></td><td>පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය</td></tr>
<tr><td>1</td><td>

<u>සම්පත් වෙන් කිරීම සහ සංවර්ධන ක්‍රියාකාරකම්</u>

2007 අංක 35 ශ්‍රීලසුබඅ පනතින් පාලනය වන ශ්‍රීලසුබඅ සියලු පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය අනුමැතීන්(PA) සහ බලශකිත් බලපත්‍ර(EP) ප්‍රදානය කිරීමේ නියාමන අධිකාරිය වේ.

✓ 2013 වර්ෂයේදී,

- නව පුනර්ජනනීය බලශක්ති (NRE) ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය අනුමැතීන් හැත්තෑ නවයක් **(79)** ක් නිකුත් කර ඇති අතර එය මෙ.වො. **168.845**ක් ලෙස ගණන් ගනු ලැබේ.
- ව්‍යාපෘති දාහතරක් **(14)** සඳහා බලශක්ති බලපත්‍ර ලබා දී ඇති අතර එය මෙ.වො.**48.84** ක් ලෙස ගණන් ගනු ලැබේ.
- **එක් කළ සමුච්චිත නව පුනර්ජනනීය බලශක්ති (NCRE) ධාරිතාවය මෙ.වො. 351.59 කි.**





දත්ත ප්‍රභවය: ශ්‍රී ලංකා බලශක්ති තුලනය

✓ බලශක්ති බලපත්‍ර ලබාගත් ව්‍යාපෘති සමඟ ගැටුමක් පැවති සහ ක්‍රියාකාරී තත්ත්වයෙන් භාර දුන් ව්‍යාපෘති දෙසිය අනූ අටක් (298) හෝ ශ්‍රීලසුබඅ පනතේ ඡේද අංක 16(2) හි දක්වා ඇති

</td></tr>
</table>

අවශ්‍යතා සමඟ අනුකූල නොවන අයුරින් අසම්පූර්ණව භාර දී තිබූ ඉල්ලුම්පත් අවලංගු කර ඇත.

ශ්‍රීලසුබඅ සෘජු මැදිහත්වීම සමඟින් ඉදුරාන ජල විදුලි බලාගාරය (කි.වො.60) සහ හම්බන්තොට සූර්ය බලශක්ති බලාගාරය (කි.වො.1237) ක්‍රියාවට නංවා ඇති අතර පුනර්ජනනීය බලශක්ති තාක්ෂණ පිළිබඳ ප්‍රදර්ශන පහසුකම් ලෙස භාවිතා කරයි.

- ✓ **සුබඅ නියමු ව්‍යාපෘති මගින් පුනර්ජනනීය බලශක්ති උත්පාදනය:**
  - කි.වො.පැ. 1,451,444 ක සූර්ය බලශක්තියක් උත්පාදනය කරන ලදී
  - කි.වො.පැ. 188,929ක ජලවිදුලි බලශතියක් උත්පාදනය කරන ලදී

2013 මාර්තු මස 08 වැනි දින අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් හම්බන්තොට සූර්ය උද්‍යානය විවෘත කිරීම
On 08th March 2013

2 __පුනර්ජනනීය බලශක්ති සම්පත් ඇගයීම__

- ✓ දිවයිනෙහි පවතින පුනර්ජනනීය බලශක්ති විභවය ඇගයීම සඳහා සුළං සහ සූර්ය මැනුම් ස්ථාන පිහිටුවන ලද අතර දීර්ඝ කාලීන පදනමින් මැනීම් ලබා ගනිමින් පවතී.

සාම්පූර්, සූරියකන්ද, නුවරඑළිය, කළමැටිය සහ බලන්ගොඩ නව සුළං මැනුම් උපකරණ ස්ථාපිත කිරීම

- ✓ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති ඇගයීම සඳහා වැඩිදුර අධ්‍යයන සිදු කරන ලද අතර මහනගරසභා ඝන අපද්‍රව්‍ය (MSW) සහ කෘෂිකාර්මික අපද්‍රව්‍ය සඳහා යෝජනා දෙකක් සකස් කරන ලදී. ඒවා සේ වනවිට සමාලෝචන අදියරෙහි පවතී.

3 <u>ග්‍රාමීය බලශක්ති සේවාවන්</u>

- ✓ ජාලයෙන් පිටත විදුලිය සැපයීමේ විකල්පය භාවිතා කරමින් ග්‍රාමීය ප්‍රජාව සඳහා විදුලිය ලබා දීම සඳහා 'ලංකාගම - තිරසර ගම්මානය' සහ 'සුනිත්‍යාලෝකය' ව්‍යාපෘති ක්‍රියාවට නංවා ඇත.

2013 ජූනි 09 වැනි දින තිරසර ගම්මානය ව්‍යාපෘතිය දියත් කරමින්

- ✓ 'ලංකාගම' ව්‍යාපෘතිය යටතේ උඳුන් 500ක් සහ CFLබල්බ 300ක් ගම්වාසීන් අතර බෙදාදුන් අතර විදුලි පාරිභෝගික සමාජයට (ECS). මෙහෙයුම් සහ නඩත්තු උපකරණ කට්ටල 04ක් ලබා දෙන ලදී.ප්‍රජා සමාජිකයින් සහ යන්ත්‍රාගාර ක්‍රියාකරුවන් ඇතුළු පුහුණුවන්නන් 25 දෙනෙකු සඳහා මෙහෙයුම් සහ නඩත්තු පුහුණුව ලබා දෙන ලදී.

'ලංකාගම' ව්‍යාපෘතිය යටතේ පිසින උඳුන් සහ උපකරණ කට්ටල බෙදා දීම

- ✓ ජාල මානනය පහසුකම (net metering facility)ප්‍රවර්ධනය කිරීම පිණිස සහන ණය ලබා දීම සඳහා ජාතික සංවර්ධන බැංකුව (NDB) සමඟ අවබෝධතා ගිවිසුමක්(MoU) අත්සන් කරන ලදී.
- ✓ පුනර්ජනනීය බලශක්ති පදනම් කරගත් තාප යෙදවුම් වැඩිදියුණු කිරීමට ප්‍රාදේශීය සභාවලජීව වායු සේවාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා මූලික සාකච්ඡා පවත්වන ලදී.
- ✓ ඌව පළාතේ පළාත් පාලන ආයතන සභාපතිවරුන් සහ තාක්ෂණ නිලධාරීන් සඳහා ග්‍රාමීය බලශක්ති සේවාවන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලද අතර මධ්‍යම පළාතේ ක්‍රියාකරුවන් සඳහා ග්‍රාමීය ජල විදුලිය පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

4 <u>දායක අරමුදල් ලැබූ ව්‍යාපෘති</u>

- ✓ **ADBඅරමුදල් ලැබූ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කරන ලදී;**
- **වතු ක්ෂුද්‍ර-ජල විදුලි පුනරුත්ථාපන සහ නැවත බලගැන්වීමේ නියමු ව්‍යාපෘතිය**: ව්‍යාපෘතියේ සංවර්ධන සංඝටකය වන්නේ ජාලය සඳහා මෙ.වො. 1.3 ක් ලබා දෙමින් ක්ෂුද්‍ර ජල විදුලි ව්‍යාපෘති 19ක් පමණ සම්බන්ධ කිරීමයි.
- **සූර්ය පියසි විදුලි උත්පාදනය නියමු ව්‍යාපෘතිය**;ව්‍යාපෘතියේ සංවර්ධන සංඝටකය වන්නේ මොරටුව විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය සහ රුහුණු විශ්වවිද්‍යාලය සූර්ය පියසි විදුලි උත්පාදන උප-ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ කොළඹ, මහනුවර සහ යාපනය නගර වටා පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් සූර්ය පියසි උප ව්‍යාපෘති (දළ වශයෙන් කි.වො.800) ක්‍රියාත්මකකිරීම.
-

බලශක්ති කළමනාකරණය

2013 වර්ෂය තුළදී පහත බලශක්ති ඉතිරිකිරීම් සිදු කරන ලදී;

- ✓ කර්මාන්ත සහ වාණිජ ක්ෂේත්‍රයන්හි බලශක්ති කාර්යක්ෂමතා ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම තුළින් මෙ.වො.පැ. 1,724 ක් ඉතිරි කිරීම.

- ✓ ප්‍රධාන වශයෙන් ඉන්ධන මාරුකිරීමේ මුලපිරීම් තුළින් ඩීසල් ලීටර 60,223ක් සහ උඳුන් තෙල් ලීටර 7,376ක් ඉතිරි කිරීම(මෙම සංඛ්‍යා කර්මාන්තවලින් ලත් ප්‍රතිචාර මත පදනම් වී ඇති බව කරුණාවෙන් සළකන්න. සත්‍ය අගයන් මෙම අගයන්ට වඩා වැඩි විය හැක)

<u>බලශක්ති කළමනාකරු/බලශක්ති විගණක වැඩසටහන</u>

2011 ජූලි මාසයේදී බලශක්ති කළමනාකරු/බලශක්ති විගණක රෙගුලාසි ප්‍රකාශයට පත් කරන ලදී. (අංක 1250 සහ 2011.07.20 දිනැති). මෙයට අනුකූල වෙමින්,

- ✓ මේ වනවිට බලශක්ති කළමනාකරුවන් 178 දෙනෙකු පත් කර ඇති අතර බලශක්ති කළමනාකරුවන් පත් කිරීම සඳහා තොග පාරිභෝගික සමාගම් උනන්දු කර ඇත.
- ✓ බලශක්ති කළමනාකරුවන් සඳහා සන්ධ්‍යා කාලීන දේශන 02 ක් සහ එක් දින පුහුණුවීම් 04ක් පවත්වා ඇත.

බලශක්ති කළමනාකරු සහ බලශක්ති විගණක රෙගුලාසි මගින් බලශක්ති විගණකවරුන් සඳහා බලාත්මක කිරීමේ ක්‍රමයක් ලබා දෙනු ලබයි. එය පදනම් කර ගනිමින් බලශක්ති කළමනාකරණ අංශය විසින් ආරම්භයේදී බලයලත් බලශක්ති විගණකවරුන් 06 දෙනෙකු පත් කරන ලද අතර සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ උත්සවය 2013 ජූලි මස 11 වැනි දින ටාජ් සමුද්‍රා හෝටලයේ ක්‍රිස්ටල් බෝල් රූම් ශාලාවේදී පවත්වන ලදී.

- ✓ බියගම, අපනයන සැකසුම් කලාපයේ කර්මාන්තශාලා හතරක පැවති ප්‍රායෝගික සැසි සමඟින් දෙවැනි බලශක්ති විගණක වැඩසටහන 2013 ජූනි/ජූලි කාලයේදී පවත්වන ලදී.
- ✓ බලශක්ති විගණකවරුන් 06 දෙනෙකු පත් කරන ලද අතර තවත් 6 දෙනෙකු තෝරාගෙන ඇති අතර පත් කිරීම සඳහා සුදුසුකම් ලබා ඇත.

2013 ජූනි/ජූලි පැවති බලශක්ති විගණක පුහුණු වැඩසටහන අවසන් කිරීමේ උත්සවයේදී සහතිකපත්‍ර ප්‍රදානය කිරීම

- ✓ බලශක්ති කාර්යක්ෂමතා ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සඳහා හෝටල් 356ක් සම්බන්ධ වී ඇත. (ස්විච් ඒෂියා වැඩසටහන ඇතුළුව)
- ✓ වතු ක්ෂේත්‍රයේ බලශක්ති කාර්යක්ෂමතා ක්‍රියාවට නැංවීමේ වැඩසටහන් තුළින් මෙ.වො.පැ. 930 ක් ඉතිරි කර ඇත.

<u>රාජ්‍ය අංශයේ බලශක්ති කළමනාකරණ වැඩසටහන</u>

- ✓ රාජ්‍ය අංශයේ ආයතනවල බලශක්ති කළමනාකරණ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා මේ වනවිට බලශක්ති කළමනාකරණ නිලධාරීන් (EMOs) 194 දෙනෙකු පත් කර ඇත.
- ✓ බලශක්ති කළනාකරණ නිලධාරීන් සඳහා බලශක්ති කළමනාකරණ මාර්ගෝපදේශ ග්‍රන්ථය සැලසුම් කරන ලදී.
- ✓ ජාතික ඵලදායිතා මහලේකම් කාර්යාලය සමඟින් ශ්‍රීලසුබඅ ඌව, නැගෙනහිර සහ උතුරු මැද පළාත්වල රාජ්‍ය අංශ සේවකයින් සඳහා "ඵලදායිතාවය වැඩිදියුණු කිරීම"පිළිබඳ හඳුන්වාදීමේ වැඩමුළු පවත්වා ඇත.

2 සම්මත සහ නියාමන හඳුන්වාදීම

- ✓ ආසන්න වශයෙන් ගි.වො.පැ. 22ක වාර්ෂික ඉතිරිකිරීමක් සඳහා හේතු වෙමින් සිවිලිං පංකා නාමකරණය කිරීමේ නියාමන 2013 ජනවාරි මාසයේදී ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ඇත.
- ✓ සිවිලිං පංකා නාමකරණය කිරීමේ පරීක්ෂණ විද්‍යාගාරයක් මොරටුව විශ්වවිද්‍යාලයේ පිහිටුවන ලදී.
- ✓ පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය ගරු සුසිල් ප්‍රේම ජයන්තමහතාගේ සහ විදුලිබල සහ බලශක්ති අමාත්‍යගරු පවිත්‍රා දේවි වන්නිආරච්චි මහත්මියගේ සහභාගිත්වයෙන් 2013 "ගෘහස්ථ යෙදවීම් සඳහා බලශක්ති කාර්යක්ෂමතා ආලෝකකරණයමාර්ගෝපදේශ" ඔක්තෝබර් මස 04 වැනි දින ටාජ් සමුද්‍රා හෝටලයේදී පැවැත්විණි.

3 උපදෙස් දීම සහ උපදේශන සේවාවන්

- ✓ ජර්මනියේ බර්කෙන්ෆීල්ඩ් විශ්විද්‍යාලයේ ද්‍රව්‍ය ගලන කළමනාකරණ ආයතනයේ සහයෝගීත්වය සමඟ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) ක්ෂේත්‍රයේ ආරම්භ කරන ලද ශක්තිමත් කිරීමේ වැඩසටහනෙහි කොටසක් ලෙස., SME සඳහා සංචාරක බලශක්ති විගණන සිදු කිරීමට තීරණය කරන ලද අතර පිහිටීම පදනම් කරගනිමින් සහභාගී වූ SME අදියර දෙකකට බෙදා වෙන් කරන ලදී. කොළඹ සහ තදාසන්න දිස්ත්‍රික්ක සඳහා පළමු අදියර 2013 නොවැම්බර් 11 සිට 2013 දෙසැම්බර් 03 දක්වා පවත්වන ලදී.

- ✓ බලශක්ති පරිභෝජන ඵලදායිතාවය සහ එමගින් බලශක්ති පිරිවැය අඩු කිරීම සඳහා රජයේ ගොඩනැගිලි හතරක් එනම් ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය, තලවාකැලේ තේ පර්යේෂණ ආයතනය, විගණකාධිති දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විගණනය කරන ලදී.

- ✓ තාප සහ විදුලි බලශක්ති දෙවර්ගයම ඇතුලත්ව ගි/.වො.පැ.14ක් ඉතිරි කිරීම සඳහා දායක වූ සංචාරක බලශක්ති විගණන185ක් (ස්විච් ඒෂියා වැඩසටහන ඇතුළුව) සිදු කර ඇත.

- ✓ බලශක්ති විගණනය සඳහා උපකරණ බැංකුවක් කාර්යක්ෂමව ක්‍රියාකාරී වූ අතර උපකරණ දින 486ක් වාර්තා වී ඇත.

4 ජයග්‍රහණ සඳහා සම්මාන ප්‍රදානය

- ✓ 2013 විදුල්කා විශ්ෂ්ට ආරම්භයත් සමඟ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, පාරිසරික සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය සමඟ සහයෝගිත්වයෙන් සංවිධානය කරනු ලැබූ ශ්‍රී ලංකා ජාතික බලශක්ති සම්මාන ප්‍රදානය (SLNEEA) 2013 දෙසැම්බර් මස 12 වැනි දින BMICH හීදි පවත්වන ලදී.

SLNEEA සම්මාන ප්‍රදානය

ආර්ථික කටුයුතු

- ✓ ජපානයේ නව බලශක්ති සංවර්ධන සංවිධානයෙහි (NEDO) තාක්ෂණික සහයෝගය ඇතිව සුනිත්‍ය බලශක්තිය හා සම්බන්ධ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදී.
- ✓ අංග තුනකින් සමන්විත වන එනම් ශ්‍රී ලංකා ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මාන ප්‍රදානය කිරීම, බලශක්ති සම්මන්ත්‍රණය සහ බලශක්ති ප්‍රදර්ශනය විදුල්කා වාර්ෂික සුනිත්‍ය බලශක්ති උත්සවය හතරවැනි වතාවටත් පවත්වන ලදී.

විදුල්කා 213-ප්‍රදර්ශනය සහ සම්මන්ත්‍රණය

- ✓ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය සමඟසහයෝගීත්වයෙන් තිරසර සංවර්ධනය සඳහා “නවයකරණ තාක්ෂණ” පිළිබඳ සම්මන්ත්‍රණයක් පැවැත්විණි.
- ✓ ජාතික සුපිරිසිදු නිෂ්පාදන මධ්‍යස්ථානය සමඟ සහයෝගිත්වයෙන් බලශක්තිය සහ තිරසර සංවර්ධනයපිළිබඳ අන්තර්ජාතික වැඩමුළුවක් පවත්වන ලදී.
- ✓ EDEX ප්‍රද්ශනය හරහා උසස් අධ්‍යාපන මට්ටමෙහි සිසුන් අතර සහ දැයට කිරුළ ප්‍රදර්ශනය හරහා මහජනතාව අතර සුනිත්‍ය බලශක්ති සංකල්ප ප්‍රවර්ධනය කරන ලදී.
- ✓ පාසල් බලශක්ති සමාජ වැඩසටහන සඳහා පාසල් 40ක් සම්බන්ධ වූ අතර බලශක්ති සංරක්ෂණ සහ පුනර්ජනනීය බලශක්ති හා සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා සිසුන් ක්‍රියාශීලීව සම්බන්ධ විය.

මූල්‍ය තත්ව

ප්‍රකාශනය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

	සටහන	2013 රු		2012 රු	
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ	3	1,227,936,857		1,355,913,508	
කෙරෙමින් පවතින කාර්යයන්	4	49,461,726		7,551,235	
ආයෝජන	5	58,528,095	1,335,926,678	55,507,154	1,418,971,897
ජංගම වත්කම්					
ලැබීමට ඇති දේ	6	11,202,454		12,449,801	
වෙනත් ජංගම වත්කම්	7	15,678,223		23,593,415	
මුදල් සහ මුදල් හා සමාන දෑ	8	269,792,827	296,673,504	159,958,726	196,001,942
මුළු වත්කම්			1,632,600,182		1,614,973,839
ස්කන්ධය සහ බැරකම්					
ස්කන්ධය					
සමුච්චිත අරමුදල	9	22,100,336		22,100,336	
ශුද්ධ අතිරික්තය		10,228,291		(25,434,679)	
විලම්භිත ප්‍රදාන	10	1,269,692,912		1,356,059,136	
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල	11	215,182,618		142,222,496	
සුනිත්‍ය සහතික කිරීමේ අරමුදල		66,528,095	1,583,732,252	63,507,154.00	1,558,454,443
ජංගම නොවන බැරකම්					
ගෙවිය යුතු පාරිතෝෂික		7,298,903	7,298,903	6,328,608	6,328,608
ජංගම බැරකම්					
වෙනත් ගෙවිය යුතු දේ	12	38,395,891		47,058,212	
කෙටි කාලීන ප්‍රතිපාදන-විගණන ගාස්තු		1,022,636		982,076	
ඉඩම් අත්පත් කර ගැනීම මත ශුද්ධ තැන්පතු		2,150,500	41,569,027	2,150,500	50,190,788
ශුද්ධ ස්කන්ධය සහ වත්කම්			1,632,600,182		1,614,973,839

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සඳහා සහ වෙනුවෙන්

අධ්‍යක්ෂ (මූල්‍ය) | **අධ්‍යක්ෂ ජනරාල්** | **සභාපති**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
2013 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

	සටහන	2013 රු.	2012 Rs.
ආදායම			
ව්‍යාපෘති වියදම් සඳහා ප්‍රාග්ධන ප්‍රදානය	13	4,008,039	37,502,139
ක්‍රමක්ෂිත විලම්භීත ප්‍රදාන	14	168,836,532	161,433,593
පුනරාවර්තන ප්‍රදාන		80,100,000	33,180,000
වෙනත් ආදායම්	15	100,906,982	98,848,394
අඩු කලා වැට් බදු		(8,255,905)	
මුළු ආදාමය		**345,595,648**	**330,964,126**
වියදම			
ව්‍යාපෘති වියදම්	16	(45,268,770)	(62,473,123)
වැටුප් සහ දීමනා	17	(52,373,903)	(48,391,942)
ගමන් වියදම් සහ යැපීම් දීමනා	18	(2,216,937)	(1,416,843)
සැපයුම්	19	(7,804,909)	(6,610,976)
නඩත්තු වියදම්	20	(6,454,313)	(5,356,408)
කොන්ත්‍රාත් සේවා	21	(23,117,830)	(19,732,818)
ක්‍රමක්ෂය වියදම්	22	(168,836,532)	(161,433,114)
වෙනත් පුනරාවර්තන වියදම්	23	(3,669,374)	(4,642,237)
කාල පරිච්ඡේදය සඳහා වියදම		**(309,742,568)**	**(310,057,461)**
පෙර වර්ෂයේ ගැලපීම්		(190,107)	-
අතිරික්තය / (ඌනනය)		**35,662,973**	**20,906,665**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

2013 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

	2013		2012	
	රු.	රු.	රු.	රු.
මෙහෙයුම් කටයුතු වලින් මූල්‍ය ප්‍රවාහය				
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය	35,853,079		20,906,665	
පසුගිය වර්ෂයේ ගැලපීම	(190,107)			
පාරිතෝෂික අරමුදල සඳහා මාරු කිරීම්				
ගැලපීම්:				
පාරිතෝෂික අරමුදල සඳහා මාරු කරන ලද	-			
ක්‍රමක්ෂිත ප්‍රදාන (ලැබූ අරමුදල් සඳහා)	(168,836,532)		(161,433,114)	
පොළී ආදායම	(3,409,193)		(5,782,567)	
සේවා පාරිතෝෂික වෙන්කිරීම්	1,062,527		860,127	
ක්ෂය	168,836,532		161,433,114	
	33,316,306		15,984,225	
වෙනත් ජංගම වත්කම් වල (වැඩිවීම)/අඩුවීම	9,162,537		20,170,207	
ජංගම බැරකම් වල වැඩිවීම/(අඩුවීම)	(8,621,761)		(3,453,603)	
මෙහෙයුම් වලින් උත්පාදිත මුදල්	33,857,082		32,700,829	
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ලැබීම්		33,857,082		32,700,829
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මූල්‍ය ප්‍රවාහය				
දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	(33,416,828)		(12,630,337)	
කෙරෙමින් පවතින වැඩ	(8,757,199)		(10,867,523)	
FD සහ TBවල ආයෝජිත/ආයෝජනයන්හි පොළිය	388,252		13,263,516	
ආයෝජන ක්‍රියාකාරකම් වල යෙදවූ ශුද්ධ මුදල්		(41,785,775)		(10,234,344)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මූල්‍ය ප්‍රවාහය				
විලම්භිත ප්‍රදාන	41,873,961		23,497,382	
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල	72,960,122		45,366,862	
සමුච්චිත අරමුදල	-			
සුනිත්‍ය සහතිකවීමේ අරමුදල	3,020,941			
පාරිතෝෂික ගෙවීම්	(92,231)		(77,195)	
මූල්‍ය ක්‍රියාකාරකම් වල යෙදවූ ශුද්ධ මුදල්		117,762,794		68,787,049
මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම		109,834,101		91,253,534
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ		159,958,726		68,705,192
කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ		269,792,827		159,958,726

අංක 5 සිට 17 දක්වා පිටු වල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල ඒකාබද්ධ කොටසක් තනයි.

<u>අවසන්</u>

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
2013 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

විස්තරය	සමුච්චිත අරමුදල	ශුද්ධ අතිරික්තය/හිඟය	විලම්භිත ප්‍රදාන	ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල	සුනිත්‍ය සහතිකවීමේ අරමුදල	එකතුව
	(රු.)	(රු.)	(රු.)	(රු.)	(රු.)	(රු.)
2012.12.31 දිනට ශේෂය	**22,100,336**	**(25,434,679)**	**1,356,059,136**	**142,222,496**	**63,507,154**	**1,558,454,443**
2011 වර්ෂය සඳහා වැඩිවීම/අඩුවීම	-	35,853,077	(86,366,224)	72,960,122.00	3,020,941	**25,467,916**
පසුගිය වර්ෂයේ ගැලපීම	-	(190,107)				**(190,107)**
2013.12.31 දිනට ශේෂය	**22,100,336**	**10,228,291**	**1,269,692,912**	**215,182,618**	**66,528,095**	**1,583,732,252**

අංක 5 සිට 17 දක්වා පිටු වල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල ඒකාබද්ධ කොටසක් තනයි.

2013.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. සංයුක්ත තොරතුර

1.1 සාමාන්‍යය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (සුබඅ) 2007 වර්ෂයේ ඔක්තෝබර් මස 01 වැනි දින ස්ථාපිත කරන ලදී. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) කාමර අංක 3G-17 හි ස්ථානගත කර ඇත.

1985 අංක 02 දරන බලශක්ති පරිවර්තන (ECF) පනත 2007 අංක 35 දරන සුනිත්‍ය බලශක්ති අධිකාරි පනත මඟින් අවලංගු කර ඇත. 2007 සැප්තැම්බර් මස 30 වැනි දිනට ECF සියළු වත්කම් සහ බැරකම් 2007 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ස්වයංක්‍රීයව SEA හි ගිණුම් වලට මාරු වී ඇත.

විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේ නියෝගය පරිදි ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය යටතේ පැවති ආලෝකකරණය සඳහා වන ප්‍රාදේශීය මධ්‍යස්ථානය (RCL) ලංකා විදුලිබල මණ්ඩලය වෙත මාරු කරන ලදී. ඒ අනුව RCL හි වත්කම්, බැරකම් සහ සේවකයින් 2012 වර්ෂයේ දෙසැම්බර් මස ලංවිම වෙත මාරු කරන ලදී.

1.2 අධිකාරියෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය; පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය කිරීම; බලශක්ති සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම; බලශක්තිය ලබාදීමෙහි සහ තොරතුරු කළමනාකරණයෙහි සුරක්ෂිතභාවය, විශ්වාසනීයත්වය සහ පිරිවැය ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් මෙහෙයවීමට බලශක්ති කාර්යක්ෂමතා ක්‍රියාමාර්ග සහ සංරක්ෂණ ක්‍රියාවට නැංවීම.

1.3 සේවක සංඛ්‍යාව

2013.12.31 වැනි දිනට සේවක සංඛ්‍යාව - 91

2.1 වැදගත් ගිණුම් ප්‍රතිපත්ති වල සාරාංශය

2.1.1 සකස් කිරීමේ පදනම අනුකූල වීමේ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව 2013 දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (ශ්‍රීලසුබඅ) ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමඟින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සකස් කර ඇත.

ශ්‍රීලසුබඅ හි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනමින් සකස් කර ඇත. අවශ්‍ය තැන්වලදී ගිණුම්කරණ ප්‍රතිපත්ති පසු සටහන් වල අනාවරණය කර ඇත.

2.1.2 සංසන්දනාත්මත සංඛ්‍යා

වර්තමාන මූල්‍ය වර්ෂයෙහි වෙනස්කම් සඳහා අනුකූල වන පරිදි සංසන්දනාත්මක සංඛ්‍යා සඳහා ගැලපීම් සිදු කර ඇත.

රජයේ ප්‍රදානයන් සඳහා ගිණුම් තැබීම සහ රජයේ සහාය අනාවරණය කිරීම.

රජයේ ප්‍රදානයන් ප්‍රාග්ධන ප්‍රදාන සහ පුනරාවර්තන ප්‍රදාන ලෙස කාණ්ඩ දෙකකට බෙදා වෙන් කරනු ලැබේ. පුනරාවර්තන වියදම්, කාර්ය මණ්ඩල වැටුප්, ගොඩනැගිලි කුලී ආදී වියදම් පියවීම සඳහා යොදා ගනු ලැබේ. ප්‍රාග්ධන ප්‍රදාන ව්‍යාපෘති/වැඩසටහන් වියදම් සහ ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා භාවිතා කරනු ලැබේ. ව්‍යාපෘති වියදම් පුනරාවර්තන සහ ප්‍රග්ධන වියදම් වලින් සමන්විත වන බැවින් එම වියදම් ප්‍රාග්ධන ප්‍රදාන වලින් දරනු ලැබේ.

වත්කමෙහි ප්‍රයෝජ්‍ය ජීව කාලය ඔස්සේ ක්‍රමානුකූල සහ තර්කාන්විත පදනමින් හඳුනාගනු ලබන රජයේ ප්‍රාග්ධන ප්‍රදාන විලම්භිත ආදායමක් ලෙස සලකනු ලැබේ.

ව්‍යාපෘති වියදම් සඳහා ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන ශීර්ෂය යටතේ, පුනරාවර්තන ව්‍යාපෘති/වැඩසටහන් වියදම් හා සම්බන්ධ වන ප්‍රදාන ආදායම් ප්‍රකාශනයෙහි බැරකමක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

2.2. දීර්ඝ කාලීන ආයෝජන සඳහා ගිණුම් තැබීම.

රජයේ භාණ්ඩාගාර බිල්පත් වල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පත් වල ආයෝජනය කර ඇති අතර පිරිවැයට දක්වා ඇත.

2.2. ආදායම හඳුනාගැනීම

බලශක්ති බලපත්‍ර ගාස්තු, විදුලිය විකිණීම, පුහුණු පාඨමාලා ගාස්තු, විදුල්කා ප්‍රදර්ශනයේ ආදායම, උපකරණ කුලියට දීම සහ වෙනත් ආදායම මගින් ආදායම නියෝජනය වේ.

සුනිත්‍ය සහතිකවීමේ අරමුදලෙහි පොළිය ආදායමක් ලෙස සළකනු ලැබේ. එහි කොටසක් නැවත ආයෝජනය කරන ලද අ කොටසක් අරමුදල් 2 නඩත්තු කිරීම /ඒ සඳහා ආදායම ඉපැයීමේ පිරිවැය සඳහා පරිභෝජනය කරන ලදී.

2.2.4 අනිශ්චිත බැරකම් සහ අනිශ්චිත වත්කම්

2008 වර්ෂයේ මාර්තු මස 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සාම්ප්‍රධායික නොවන පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින්ගෙන් මිලදී ගන්නා ලද විදුලි බලය සඳහා ඇස්තමේන්තුගත රු.මි. 897 ක් ශ්‍රීලසුබඅ විසින් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු වේ. මෙම ගෙවීම සිදු කිරීම සඳහා මේවන විට ක්‍රමයක් නොමැති අතර ඒ සඳහා භාණ්ඩාගාර අරමුදල් හෝ සෙස් බදු හෝ පුරස්කාර තුලින් උපයාගත යුතු වේ. මේවා භාණ්ඩාගාර අනුමැතියට යටත් වේ. එබැවින් මෙය අවිනිශ්චිත බැරකමක් ලෙස පමණක් අනාවරණය කර ඇත.

2.3 දේපල, පිරියත සහ උපකරණ

2.4 බැරකම් සහ ප්‍රතිපාදන

2.4.1 පාරිතෝෂිත

මූලා වර්ෂයේ අවසන් මාසයේ වැටුප පදනම් කර ගනිමින් අඩ මසක වැටුප හා සමාන මුදලක් පාරිතෝෂිකයක් වශයෙන් සියළුම සේවකයින් සඳහා වෙන් කර ඇත.

2.4.2 EPF & ETF

අදාල නීති සහ නියාමනයන්ට අනුව EPF & ETF සඳහා දායකවීමට සේවකයින් හිමිකම් ලබයි. EPF & ETF සඳහා ශ්‍රී.ල.සු.බ.අ හි දායකත්වය පිළිවෙළින් 12% සහ 3% කි.

2.4.5 කළමනාකරණ මණ්ඩල අනුමැතිය

මෙම මූලා ප්‍රකාශන 2014.12.30 දින අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

මාසයක කාලයක් සඳහා ක්‍රමක්ෂය පහත දක්වා ඇත:

අයිතමය	ක්‍රමක්ෂය අනුපාතය
ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ	25%
මෝටර් වාහන	20%
ඡායාපිටපත් යන්ත්‍රය	25%
පරිගණක	33.33%
විදුලි භාණ්ඩ	25%
පුස්තකාල පොත්	20%
බලශක්ති උපකරණ	33.33%
ප්‍රදර්ශන උපකරණ	25%
සුළං කුළුණු	20%
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	5%

<u>සූර්ය බලශක්ති ව්‍යාපෘති:</u>

A. සූර්ය පැනල්	5%
B. යකඩ ව්‍යූහ	10%
C. ගොඩනැගිලි	5%
D. ස්විච්චිපන්න	20%
E. අපවර්තක	20%
F. ට්‍රාන්ස්ෆෝමර්	5%
G. විදුලි ඉලෙක්ට්‍රොනික්	33.33%
I. සනීපාරක්ෂක සහ ජලනල වැඩ	5%
J. රැහැන්	20%
K.ගෘහභාණ්ඩ සවිකිරීම් සහ කාර්යාලීය උප:	25%
L. මෙවලම්	33%
M. යන්ත්‍රසූත්‍ර	20%
H. වෙනත්	20%

සටහන 3 :

දේපල,පිරියත සහ උපකරණ

ස්ථාවර වත්කම්

විස්තරය	2012.12.31 දිනට ශේෂය රු.	2013 කාල පරිච්ඡේදය තුලදී අත්පත්කර ගැනීම්	2013.12.31 දිනට ශේෂය රු.
ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ	11,590,111	2,271,385	13,861,495
මෝටර් වාහන	45,811,750	204,800	46,016,550
ඡායාපිටපත් යන්ත්‍රය	1,963,791	1,030,400	2,994,191
පරිගණක	25,430,487	3,742,082	29,172,570
විදුලි භාණ්ඩ	218,468	61,792	280,260
පුස්තකාල පොත්	453,352	(0)	453,352
බලශක්ති උපකරණ	76,887,347	3,182,088	80,069,435
සුළං කුළුණු සහ උපකරණ	28,644,898	16,970,253	45,615,151
සූර්ය සහ කුඩා ජල විදුලි ව්‍යාපෘති:		-	
A. සූර්ය පනේල	655,143,926	3,904,422	659,048,348
B. යකඩ ව්‍යුහ	222,261,738	0	222,261,738
C. ගොඩනැගිලි	123,667,779	3,391,838	127,059,617
D. ස්විච්විපන්න	13,973,767	-	13,973,767
E. අපවර්තක	78,637,410	-	78,637,410
F. ට්‍රාන්ස්ෆෝමර	45,753,626	-	45,753,626
G. විදුලි ඉලෙක්ට්‍රෝනික්	25,473,252	5,784,688	31,257,940
I. සනීපාරක්ෂක සහ ජලනල සවිකිරීම්	166,360,476	113,424	166,473,900
J. රැහැන්	100,224,571	-	100,224,571
K. ගෘහභාණ්ඩ සවිකිරීම් සහ කාර්යාලීය උපකරණ	2,964,429	50,155	3,014,584
L. මෙවලම්	13,977,290	-	13,977,290
M. යන්ත්‍රසූත්‍ර	4,001,375	-	4,001,375
H. වෙනත්	59,891,677	147,987	60,039,664
		-	
ප්‍රදර්ශන උපකරණ	354,853	0	354,853
	1,703,686,373	**40,855,315**	**1,744,541,687**

ක්‍රමක්ෂය ගිණුම

ක්‍රමක්ෂය	ක්‍රමක්ෂය අනුපාතිකය	2012.12.31 දිනට ශේෂය රු.	2013 වර්ෂය සඳහා ක්‍රමක්ෂය රු.	2013.12.31 දිනට ශේෂය රු.	2013.12.31 දිනට ශුද්ධ පොත් අගය රු.
ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ	25	10,037,147	1,176,175	11,213,322	2,648,173
මෝටර් වාහන	20	39,937,573	5,741,771	45,679,344	337,206
ඡායාපිටපත් යන්ත්‍රය	25	1,370,979	1,598,473	2,969,452	24,739
පරිගණක	33.33	17,406,918	3,054,716	20,461,634	8,710,935
විදුලි භාණ්ඩ	25	218,468	7,073	225,541	54,719
පුස්තකාල පොත්	20	387,224	24,953	412,177	41,175
බලශක්ති උපකරණ	33.33	66,091,712	11,379,385	77,471,097	2,598,338
සුළං කුළුණු සහ උපකරණ	20	11,562,529	7,781,052	19,343,581	26,271,570
සූර්ය සහ කුඩා ජල විදුලි ව්‍යාපෘති:				-	-
A. සූර්ය පනේල	5	49,811,143	32,944,499	82,755,642	576,292,706
B. යකඩ ව්‍යුහ	10	32,181,018	22,226,174	54,407,192	167,854,546
C. ගොඩනැගිලි	5	9,435,385	6,184,571	15,619,956	111,439,661
D. ස්විච්චිපන්න	20	5,398,085	2,794,753	8,192,838	5,780,929
E. අපවර්තක	20	24,373,852	15,727,482	40,101,334	38,536,076
F. ට්‍රාන්ස්ෆෝමර	5	3,373,096	2,287,681	5,660,777	40,092,849
G. විදුලි ඉලෙක්ට්‍රෝනික්	33.33	10,612,689	9,330,832	19,943,521	11,314,419
I. සනීපාරක්ෂක සහ ජලනල සවිකිරීම්	5	11,804,757	8,320,494	20,125,251	146,348,649
J. රැහැන්	20	28,624,755	20,044,914	48,669,669	51,554,902
K. ගෘහභාණ්ඩ සවිකිරීම් සහ කාර්යාලීය උපකරණ	25	1,051,763	741,142	1,792,905	1,221,679
L. මෙවලම්	33.33	6,611,139	4,658,631	11,269,770	2,707,520
M. යන්ත්‍රසූත්‍ර	20	188,705	800,275	988,980	3,012,395
H. වෙනත්	20	16,943,135	12,003,986	28,947,121	31,092,543
				-	-
ප්‍රදර්ශන උපකරණ	25	350,791	7,500	353,725	1,128
		347,772,865	**168,836,532**	**516,604,830**	**1,227,936,857**

සටහන 4 : කෙරෙමින් පවතින වැඩ

	31.12.2013	31.12.2012
පුනර්ජනනීය බලශක්ති ඇගයීම	2,377,000	2,377,000
හම්බන්තොට සූර්ය බලශකිත් උද්‍යානය	4,332,591	3,517,591
ඉඳුරාන කුඩා ජල විදුලි ව්‍යාපෘතිය	352,608	1,656,644
බලන්ගොඩ සුළං කුළුණ	-	-
රෙෆ්රිජිරේටෝ පරීක්ෂණ උපකරණය	42,104,027	
WIP නව රඟහල නිෂ්පාදනය	295,500	
	49,461,726	7,551,235

සටහන 5 : ආයෝජන

ස්ථාවර තැන්පතු (බොරැල්ල ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පත් කර ඇති)

අයෝජනය කරන ලද දිනය	කල්පිරෙන දිනය	ආයෝජන අනුපාතිකය	තැන්පතු ලියාපදිංචි කිරීමේ අංකය	2013.12.31 දිනට තැන්පතු	2012.12.31 දිනට තැන්පතු
21.09.2011.			2-0061-05-10246		-
21.09.2011.			2-0061-05-10238		-
21.09.2011.			2-0061-05-10220		-
21.09.2011.			2-0061-05-10360		-
21.09.2011.			2-0061-05-10394		-
21.09.2011.			2-0061-05-10467		-
21.09.2011.			2-0061-05-10459		
21.09.2011.	21.09.2014	10.5%	2-0061-05-10416	1,200,000	1,200,000
21.09.2011.	21.09.2014	10.5%	2-0061-05-10432	1,200,000	1,200,000
21.09.2011.	21.09.2014	10.5%	2-0061-05-10408	1,200,000	1,200,000
21.09.2011.	21.09.2014	10.5%	2-0061-05-10343	1,200,000	1,200,000
21.09.2011.	21.09.2014	10.5%	2-0061-05-10335	1,200,000	1,200,000
21.09.2011.	21.09.2014	10.5%	2-0061-05-10378	1,200,000	1,200,000
21.09.2011.	21.09.2014	10.5%	2-0061-05-10386	1,200,000	1,200,000
21.09.2011.	21.09.2014	10.5%	2-0061-05-10327	1,200,000	1,200,000
21.09.2011.	21.09.2014	10.5%	2-0061-05-10319	1,200,000	1,200,000
21.09.2011.	21.09.2014	10.5%	2-0061-05-10297	1,200,000	1,200,000
21.09.2011.	21.09.2014	10.5%	2-0061-05-10289	1,200,000	1,200,000
21.09.2011.	21.09.2014	10.5%	2-0061-05-102262	1,200,000	1,200,000
21.09.2011.	21.09.2014	10.5%	2-0061-05-10254	1,200,000	1,200,000
25.09.2011.	25.09.2014	10.5%	2-0061-04-12376	450,000	450,000
05.10.2011.	05.10.2014	10.0%	2-0061-03-09834	2,800,000	2,800,000
				18,850,000	**18,850,000**

භාණ්ඩාගාර බිල්පත් - මහජන බැංකුවේ ප්‍රධාන ශාඛාව

අයෝජනය කරන ලද දිනය	කල්පිරෙන දිනය	ආයෝජන අනුපාතිකය	තැන්පතු ලියාපදිංචි කිරීමේ අංකය	2013.12.31 දිනට තැන්පත්	2012.12.31 දිනට තැන්පත්
18.01.2011.	17.01.2014	10.85%	LKB00615C156	12,489,626	12,489,626
09.07.2011.	11.07.2014	10.25%	LKB00314J011	27,188,469	24,167,528
				39,678,095	**36,657,154**

මුළු එකතුව	**58,528,095**	**55,507,154**

සටහන 6 - ලැබිය යුතු දේ

ස්ථාවර තැන්පත් වලින් ලැබිය යුත් පොළී

අයෝජනය කරන ලද දිනය	කල්පිරෙන දිනය	ආයෝජන අනුපාතිකය	2013.12.31 දිනට තැන්පතු	2013 සඳහා ලැබිය යුතු රු.	2012 සඳහා ලැබිය යුතු රු.
21.09.2011.					
21.09.2011.					
21.09.2011.					
21.09.2011.					
21.09.2011.					
21.09.2011.					
21.09.2011.					
21.09.2011.	21.09.2013	10.5%	1,200,000	33,000	43,275
21.09.2011.	21.09.2013	10.5%	1,200,000	33,000	43,275
21.09.2011.	21.09.2013	10.5%	1,200,000	33,000	43,275
21.09.2011.	21.09.2013	10.5%	1,200,000	33,000	43,275
21.09.2011.	21.09.2013	10.5%	1,200,000	33,000	43,275
21.09.2011.	21.09.2013	10.5%	1,200,000	33,000	43,275
21.09.2011.	21.09.2013	10.5%	1,200,000	33,000	43,275
21.09.2011.	21.09.2013	10.5%	1,200,000	33,000	43,275
21.09.2011.	21.09.2013	10.5%	1,200,000	33,000	43,275
21.09.2011.	21.09.2013	10.5%	1,200,000	33,000	43,275
21.09.2011.	21.09.2013	10.5%	1,200,000	33,000	43,275
21.09.2011.	21.09.2013	10.5%	1,200,000	33,000	43,275
21.09.2011.	21.09.2013	10.5%	1,200,000	33,000	43,275
25.09.2011.	25.09.2013	10.0%	450,000	11,875	16,228
05.10.2011.	05.10.2013	10.0%	2,800,000	66,111	100,975
			18,850,000	506,986	679,777

භාණ්ඩාගාර බිල්පත් වලින් ලැබිය යුතු පොළී

අයෝජනය කරන ලද දිනය	කල්පිරෙන දිනය	ආයෝජන අනුපාතිකය	2013.12.31 දිනට තැන්පතු	2013 සඳහා ලැබිය යුතු රු.	2012 සඳහා ලැබිය යුතු රු.
18.01.2011.	17.01.2013.	10.85%	12,489,626	1,309,954	1,050,908
09.07.2011.	11.07.2013	10.25%	27,188,469	1,315,997	1,448,396
			39,678,095	2,625,951	2,499,304

ලැබිය යුතු ආදායම - බලශක්ති උපකරණ කුලියට දීම

	31.12.2013	31.12.2012.
බාන්ඩිස් ෆිනිෂින්ග් සමාගම - 2005	4,850	4,850
බීඑම්අයි හෝල්ඩින්ග්ස් (පෞද්.) සමාගම - 2005	7,200	7,200
හේලිස් ඉන්ඩස්ට්‍රියල් සොලූෂන්ස් -2005	500	500
එනර්ෆැබ් (පෞද්.) සමාගම -2006	3,750	3,750
ඇක්සස් එනර්ජි සොලූෂන්ස්	500	500
ඇක්සස් එනර්ජි සොලූෂන්ස්	500	500
බ්‍රැන්ඩික්ස්	2,650	2,650
ඩිමෝ	1,600	1,600
එනර්ජි සොලූෂන්ස් සමාගම	5,750	5,750
නැෂනල් ක්ලීනර් ප්‍රොඩක්ෂන් සෙන්ටර්	750	750
මාර්ස් ඇක්ටිව්	2,400	2,400
ඉංජිනියරින් ඩිසයින් සෙන්ටර්	5,000	5,000
ග්ලයිඩ් (පෞද්.) සමාගම	150	150
ස්ලීමා	250	250
	35,850	35,850
ලැබිය යුතු දේ -විදුල්කා ආදායම	374,675	472,175
විදුලි උත්පාදන -ඉඳුරාන	-	80,270
පුහුණු වැඩසටහන		
විදුලි උත්පාදනය -හම්බන්තොට	2,812,500	8,682,425
පසුගිය වර්ෂයේ ගැලපීම්		
ලැබිය යුතු දේ -සේවකයින්	2,138	
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් VAT බැර	4,702,660	
පිපල්ස් ට්‍රැවල් පෞද්ගලික සමාගම	95,550	
	8,023,373	**9,270,720**
මුළු එකතුව	11,202,454	12,449,801

	31.12.2013.	31.12.2012.
සටහන **7:** වෙනත් ජංගම වත්කම්		
අත්තිකාරම්		
CFL ණය	-	194,673
බලශක්ති අරමුදලින් අධිකාරියේ අරමුදලට ලැබීම්		7,269,950
අධිකාරියේ අරමුදලින් බලශක්ති අරමුදලට ලැබීම්	7,444,270	
විදුලිබල සහ බලශක්ති අමාත්‍යවරයා විසින් ණයට ගත් ලංවිම ලැබීම්		8,000,000
උත්සව අත්තිකාරම්		
වෛද්‍ය රක්ෂණ	500	500
අත්තිකාරම් ගිණුම	98,500	
ජාතික ජල සම්පත් මණ්ඩලය		
අත්තිකාරම්, තැන්පතු, ඉන්ධන ආදී	136,500	136,500
විශේෂ අත්තිකාරම්		
ආපදා ණය		
ලංවිම තැන්පතු - හම්බන්තොට	52,000	52,000
ලංවිම තැන්පතු- ඉඳුරාන	62,500	62,500
දුරකථන තැන්පතු	8,775	8,775
දුරකථන තැන්පතු - මොබිටෙල්	2,000	
SWRDB ජාතික අනුස්මරණ අරමුදල- තැන්පතු	38,886	240,000
සේවක පුහුණු වැඩසටහන් අත්තිකාරම්	187,450	80,000
වැඩසටහන් සඳහා අත්තිකාරම්	137,333	161,185
තැන්පතු - හම්බන්තොට හෝටල් කුලී	132,000	
අත්තිකාරම් තැන්පතු - සිප්‍රින් වෝටර් පෞද්. සමාගම	3,500	
	8,304,214	**16,206,083**
සක්‍රිය අරමුදල		
ආපදා ණය	7,288,521	7,314,344
විශේෂ අත්තිකාරම්	5,000	500
උත්සව අත්තිකාරම්	80,489	72,489
	7,374,010	**7,387,332**
	15,678,223	23,593,415

සටහන **8:** මුදල සහ මුදල් හා සමාන දෑ		
ජාතික ඉතිරිකිරීමේ බැංකුව - බොරැල්ල	207,151,805	149,942,180
මහජන බැංකුව-SEA-078-1-001-8-8-503576	12,387,146	5,798,073
මහජන බැංකුව-SEA-078-1-002-7-8-503576	4,578,684	3,082,245
ලංකා බැංකුව-ටොරින්ටන්-සක්‍රිය අරමුදල	1,463,745	1,136,228
ලංකා බැංකුව-ටොරින්ටන්-අධිකාරියේ අරමුදල	44,211,447	
	269,792,827	**159,958,726**

සටහන **9 :** සමුච්චිත අරමුදල

2007 ඔක්තෝබර් 01 දින ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට (SLSEA) මාරු කරන ලද බලශක්ති සංරක්ෂණ අරමුදලේ (ECF) සමුච්චිත අරමුදල සැප්තැම්බර් 30 වැනි දිනට

එය පහත දෑ වලින් සමන්විත වේ :

2007 සැප්තැම්බර් 30 දිනට සමුච්චිත අරමුදල	7,076,392	61,244,579
ආරම්භක ප්‍රාග්ධනය	5,000,000	5,000,000
විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය- ප්‍රාග්ධන ප්‍රදාන	5,761,145	5,761,145
UNDP ප්‍රාග්ධන ප්‍රදාන	3,612,560	3,612,560
ආහාර සහ කෘෂිකර්ම සංවිධානය - දායක ප්‍රදාන	650,239	650,239
සුනිත්‍ය සහතිකවීමේ අරමුදල		
එකතුව	22,100,336	76,268,523

	2013	2012
සටහන 10: විලම්භීත ප්‍රදාන		
ප්‍රාග්ධන ප්‍රදාන 2008	33,687,060	33,687,060
ප්‍රාග්ධන ප්‍රදාන 2009	11,705,408	11,705,408
විදේශ ප්‍රදාන 2009 - ජපන්	24,165,380	24,165,380
ප්‍රාග්ධන ප්‍රදාන 2010 -හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානය (WIP)	46,693,991	46,693,991
-ක්‍රමක්ෂිත ප්‍රාග්ධන ප්‍රදාන	10,563,444	10,563,444
විදේශ ප්‍රදාන 2010-ජපන්	11,419,569	11,419,569
ප්‍රාග්ධන ප්‍රධාන 2011-ඉඳුරාන කුඩා ජලවිදුලි ව්‍යාපෘතිය (WIP)	15,523,945	15,523,945
-ක්‍රමක්ෂිත ප්‍රාග්ධන ප්‍රදාන - ඉඳුරාන MHP	68,548,216	68,548,216
විදේශ ප්‍රදාන 2011-ජපන්	1,155,016,402	1,155,016,402
- කොරියානු	191,097,075	191,097,075
විලම්භීත ප්‍රදාන -විදේශ ආධාර -2012 -ADB	15,082,346	15,082,346
භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන-2012	23,497,861	23,497,861
විලම්භීත ප්‍රදාන -ADB- 2013	40,560,683	
විලම්භීත ප්‍රදාන -KOIKA- 2013	35,662	
භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන/FARDF -2013	41,873,961	
අඩුකලා:		
-ක්‍රමක්ෂය-2013	(168,836,532)	
-ක්‍රමක්ෂය-2012	(161,433,593)	(161,433,593)
-ක්‍රමක්ෂය-2011	(63,289,946)	(63,289,946)
- පසුගිය වර්ෂ සඳහා ක්‍රමක්ෂය	(26,218,020)	(26,218,020)
	1,269,692,912	**1,356,059,138**

	2013	2012
සටහන 11:		
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල		
RE ආදායම	193,172,615	130,426,630
උපකරණ කුලියට දීම සහ බලශක්ති විගණන	12,284,781	10,769,803
ඉතිරිකිරීම් ගිණුමේ පොළිය - NSB	15,725,222	7,026,063
ජනමාධ්‍ය මඟින් සිදුකල දැනුවත්කිරීම් සඳහා ලබාගත්	(6,000,000)	(6,000,000)
	215,182,618	**142,222,496**

	2013	2012
සටහන 12: ගෙවිය යුතු වෙනත්		
සුනිත්‍ය බලශක්ති අරමුදල	7,444,270	
අධිකාරියේ අරමුදලට ගෙවිය යුතු		7,269,950
සුනිත්‍ය බලශක්ති සහතිකවීමේ අරමුදල	-	
ස්විච් ඒෂියා පාලන ගිණුම	4,548,176	3,051,737
විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය	500	500
උපචිත වියදම්	23,208,177	29,294,019
ණයහිමියන්		
පුනර්ජනනීය බලශක්ති-ඉ නෙට් සොලූෂන්ස් (පෞද්.) සමාගම	1,667,500	1,667,500
බලශක්ති උපකරණ අත්පත් කර ගැනීම		
-ඉ නෙට් සොලූෂන්ස් (පෞද්.) සමාගම	326,025	326,025
රඳවාගැනීම්	519,392	3,634,360
රඳවාගැනීම්	-	
නාරාහේන්පිට ජාතික පොළ	99,405	99,405
විවිධ ණය හිමියන්		
ශ්‍රී ලංකා රේගුව	310,748	310,748
සුහසාධක සංගමය SEA	442	442
ගෙවිය යුතු විවිධ		984,269
ආපසු ගෙවිය යුතු තැන්පතු		
ඊ නෙට් සොලූෂන්ස් (පෞද්.) සමාගම	10,000	10,000
ඊඑන්එල් කන්සල්ටන්ට්	150,000	150,000
ඊ නෙට් සොලූෂන්ස් (පෞද්.) සමාගම		
සිග්මා ටෙක්නොලෝජීස්	10,000	10,000
රේන්කෝ රිනීවබල් එනර්ජි පෞද්ග සමාගම	30,000	30,000
ගාමිණී සේනානායක		-
Accruals		
O vertime		
Travelling		
Office Rent		
Telecom Pvt Ltd		
Mobitel Pvt Ltd		
විදුල්කා ප්‍රදර්ශනය	9,256	9,256
වාහන බැහැරකිරීමේ ටෙන්ඩරය	8,000	156,000
ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව	54,000	54,000
	38,395,891	**47,058,212**

	31.12.2013.	31.12.2012.
සටහන 13 : ව්‍යාපෘති වියදම් සඳහා ප්‍රාග්ධන ප්‍රදාන		
භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රාග්ධන ප්‍රදාන	43,600,000	61,000,000
FR 295 (1) යටතේ මාරු ගෙවීම්	-	
FASRDF -2013	2,282,000	
අඩුකලා:		
හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානය	-	-
කෙරෙමින් පවතින වැඩ	8,457,133	10,867,523
ප්‍රවර්තන වර්ෂය තුලදී අත්පත් කර ගන්නා ලද ප්‍රාග්ධන වත්කම්	33,416,828	12,630,338
	4,008,039	**37,502,139**

සටහන 14 : ක්‍රමක්ෂිත විලම්භිත ප්‍රදාන		
ප්‍රවර්තන වර්ෂය සඳහා ක්‍රමක්ෂය	168,836,532	161,433,593
පසුගිය වර්ෂය සඳහා ක්‍රමක්ෂය		
	168,836,532	**161,433,593**

සටහන 15 : වෙනත් ආදායම්		
බලශක්ති බලපත්‍ර ගාස්තු	39,075,970	**30,269,950**
ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වල පොළිය	3,409,193	5,782,567
SAARC බලශක්ති කේන්ද්‍රය		528,917
ආපදා ණය පොළිය	296,166	294,114
විශේෂ අත්තිකාරම් පොළිය	2,953	2,293
විදුලි උත්පාදනයෙන් ලත් ආදායම - හම්බන්තොට	32,700,680	37,278,565
විදුලි උත්පාදනයෙන් ලත් ආදායම - ඉඳුරාන	2,403,238	80,270
විදුල්කා ප්‍රදර්ශනය (අනුග්‍රාහකත්වය)	2,750,000	9,707,415
විදුල්කා ප්‍රදර්ශනය (වෙළඳසැල්)	2,925,801	
ස්විච් ඒෂියා වැඩසටහන		-
බලශක්ති කළමනාකරුවන් බලගැන්වීම	2,509,200	1,639,300
වෙනත් ආදායම්	2,628,936	269,692
බලශක්ති අරමුලෙන් ලත් ආදායම		6,000,000
ආලෝකකරණය සඳහා ප්‍රාදේශීය මධ්‍යස්ථානය	16,200	6,995,311
පසුගිය වර්ෂයේ ගැලපීම්		
වැට් බදු ගෙවීම සඳහා බලශක්ති අරමුදලෙන් මාරු කළා	3,932,740	
බදු අයකල හැකි ආදායම මත වැට් බදු	8,255,905	
	100,906,982	**98,848,394**

සටහන 16 :ව්‍යාපෘති වියදම්

පුනර්ජනනීය බලශක්ති		
සුළං විභව අතිරික්තයෙන් හයිඩ්‍රජන් - ප්‍රවාහන යෙදවුම		
විදුලි වාහන තාක්ෂණ සංවර්ධනය	12,990	680
වෙළඳපොළ අපද්‍රව්‍යවලින් ජීව වායු උත්පාදනය කිරීමේ ප්‍රදර්ශක	294,899	5,738
ජෛව ඉන්ධන සඳහා ප්‍රමිත සකස් කිරීම		
කාර්යක්ෂම දර උඳුන් ප්‍රවර්ධනය කිරීම		228,285
ශ්‍රී ලංකාවේ සංකීර්ණ භූමි භාග සඳහා ගැළපෙන කුඩා පරිමාණයේ WECS		
දත්ත විකිණීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීම		
CDM ලියකියවිලි සකස් කිරීම සඳහා පෞද්ගලික අංශයට සහාය වීම		

	31.12.2013.	31.12.2012.
සියලු පැරණි සහ පවතින සුළං මිනුම් ස්ථාන ආවරණය කරමින් විස්තීර්ණ සුළං දත්ත සමුදායක් සකස් කිරීම		
එක් එක් සම්පත් වර්ගය සඳහා පුනර්ජනනීය බලශක්ති සම්පත් සිතියම් සකස් කිරීම සහ ඇස්තමේන්තුගත RE විභවය පිළිබඳව වාර්තා කිරීම	402,231	1,460,244
RE හි උපරිම විනිවිද යෑමේ මට්ටම නිශ්චය කිරීම		
බලශක්ති වන වගා දිරි ගැන්වීම සහ ජෛව ස්කන්ධ කලාප 1ක් ස්ථාපිත කිරීම		1,165
දීර්ඝ කාලීන සුළං/සූර්ය මිනුම් ස්ථාන 10ක් ස්ථාපිත කිරීම, උතුරු පළාතේ සුළං මිනුම් ස්ථාන 3ක් ස්ථාපිත කිරීම, මුහුදු රළ බලශක්ති සම්පත් ඇගයීමක් ආරම්භ කිරීම	1,437,640	414,647
කිසියම් සම්පත් ස්ථානයක විභවය සම්පූර්ණයෙන්ම පරිභෝජනය කිරීම සඳහා නියාමනයන්ට සංශෝධන සිදු කිරීම		15,755
ජාල සම්බන්ධිත සූර්ය විදුලිබල උත්පාදනය සඳහා අංග සම්පූර්ණ බලශක්ති උද්‍යානයක් ස්ථාපිත කිරීම	8,290,344	7,102,263
ජාල සම්බන්ධිත මෙ.වො. 100 ක සුළං ගොවිපොළක් සඳහා අංග සම්පූර්ණ බලශක්ති උද්‍යානයක් ස්ථාපිත කිරීම	900	150,580
ජනාධිපති කාර්ය සාධන බලකා වාර්තාවෙහි දක්වා ඇති පරිදි ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා මේ වන විටත් යෝජිත නව ක්‍රමවේදය	126,000	67,256
ජාතික ප්‍රමුඛතාවක් ලෙස NCRE කර්මාන්තය සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වෙනත් අදාළ ආයතන සමඟ කටයුතු කිරීම	243,997	
පුනර්ජනනීය බලශක්ති සම්පත් වෙන් කිරීම	652,056	
බලශක්ති අංශ ආයෝජන ප්‍රවර්ධනය (පෞද්ගලික අංශයට පහසුකම් සැපයීම)	1,268,635	
ජාතික ප්‍රමුඛතාවක් ලෙස NCRE කර්මාන්තය සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වෙනත් අදාළ ආයතන සමඟ කටයුතු කිරීම		933,034
ඉඩම් ගැටළු සම්බන්ධයෙන් සේවා ලබා දීම සඳහා SEA තුළ මූලික සම්බන්ධතාවයක් සිථාපිත කිරීම		489,092
ව්‍යාපෘති අනුමත කිරීම හා සම්බන්ධ ගැටළු විසඳීම		
පුනර්ජනනීය බලශක්ති සම්පත් වෙන් කිරීම		1,031,084
ආරවුල් විසඳීම		
RE ව්‍යාපෘතිවල බලශක්ති අංශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම		
බලශක්ති අංශ ආයෝජන ප්‍රවර්ධනය (පෞද්ගලික අංශයට පහසුකම් සැපයීම)		186,623
GIS රටවල ජල විදුලි බලයෙහි සම්පූර්ණ ආර්ථික විභවය සාක්ෂාත් කර ගැනීම		8,925
ජාලයෙන් පිටත යෙදවුම් සඳහා යොදා ගත හැකි ප්‍රදේශ සහ එවැනි ප්‍රදේශ සඳහා පවතින සම්පත් විකල්ප හඳුනා ගැනීම		
ජාලයෙන් පිටත විදුලිබලය සැපයීමේ අවස්ථාව භාවිත කරමින් ගම්මාන 10ක් සඳහා විදුලිය ලබා දීම	1,383,733	6,545,905
තෝරා ගත් ස්ථානයන්හි RE ව්‍යාපෘතිවල පශ්වාත් ස්ථාපිත ප්‍රගති අධීක්ෂණය සහ බලපෑම ඇගයීම	32,256	7,990
ශ්‍රී ලංකා බලශක්ති තුලනය	1,407,068	1,554,677
සුනිත්‍ය බලශක්ති ක්ෂේත්‍රය සඳහා සහායක ව්‍යාපෘති	270,008	
පිරිසිදු බලශක්තිය සහ ජාල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ	71,110	
	15,893,866	20,203,943
බලශක්ති කළමනාකරණය		
තොග බලශක්ති පරිභෝජන ආයතනවල ක්‍රමානුකූල බලශක්ති ප්‍රවේශයන් සඳහා ක්‍රියා පිළිවෙළ		1,554,199
බලශක්ති නාමකරණ වැඩසටහන		207,661
විද්‍යාගාර පහසුකම් ස්ථාපිත කිරීම (ADB සහාය තුළින්)		
UDA ගොඩනැගිලි අනුමැතිය ලබා දීමේ ක්‍රියාවලියට, විමර්ශන අත්පොත් තුළට සංග්‍රහය අන්තර්ගත කිරීම සහ සංග්‍රහය සමාලෝචනය කිරීම		19,800
මෝටර් පරීක්ෂා කිරීමේ පහසුකම් ස්ථාපිත කිරීම		250,700
අංශ විශේෂිත වැඩසටහන්		57,965

	31.12.2013.	31.12.2012.
සටහන 18: ගමන් වියදම් සහ යැපීම්		
ගමන් වියදම් - දේශීය	765,651	864,889
ගමන් වියදම් -විදේශ	1,451,286	551,955
	2,216,937	**1,416,843**
සටහන 19: සැපයුම්		
මුද්‍රණ, ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා	2,483,958	2,247,951
ඉන්ධන සහ ලිහිසි තෙල්	5,197,124	4,279,789
වෙනත්-පුවත්පත් සහ විවිධ සේවා	123,827	83,236
	7,804,909	**6,610,976**
සටහන 20: නඩත්තු වියදම්		
වාහන නඩත්තු සහ රක්ෂණ සහ බලපත්‍ර ගාස්තු	5,879,835	5,027,580
කාර්යාලීය උපකරණ නඩත්තු කිරීම	574,478	328,828
	6,454,313	**5,356,408**
සටහන 21: කොන්ත්‍රාත් සේවා		
කාර්යාල කුලී සහ බදු ගාස්තු	19,896,097	17,467,060
තැපැල් සහ විදුලි සංදේශ ගාස්තු	2,402,832	1,858,127
ප්‍රවාහන	218,901	57,630
විගණන ගාස්තු	600,000	350,000
	23,117,830	**19,732,818**
සටහන 22: ක්‍රමක්ෂය වියදම්		
ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ	1,176,175	1,406,196
මෝටර් වාහන	5,741,771	7,236,969
ඡායා පිටපත් යන්ත්‍රය	1,598,473	312,465
පරිගණක	3,054,716	3,140,658
විදුලි භාණ්ඩ	7,073	683
පුස්තකාල පොත්	24,953	28,413
බලශක්ති උපකරණ	11,379,385	10,380,701
සුළං කුළුණු සහ උපකරණ	7,781,052	5,446,151
හම්බන්තොට බලශක්ති උද්‍යානය	138,065,434	133,466,606
ප්‍රදර්ශන උපකරණ	7,500	14,272
	168,836,532	**161,433,114**
සටහන 23: වෙනත් පුනරාවර්තන වියදම්		
කාර්යාලීය සහ වෙනත් විවිධ වියදම්	988,577	3,036,643
පරිවර්තන ගාස්තු	46,486	65,406
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ දීමනා	452,000	718,000
ආහාරපාන ගාස්තු	886,708	339,630
දේශීය පුහුණු වැඩසටහන	514,702	482,558
බැංකු ගාස්තු	2,307	
විදුල්කා සහ මහජන දැනුවත් කිරීම්	469,237	
ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT)	309,356	
	3,669,374	**4,642,237**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No.	ඊඑච්/අයි/එස්එල්එස්ඊඒ/එෆ්ඒ /2013	ඔබේ අංකය உமது இல. Your No.	
දිනය திகதி Date	2015 මැයි 15 දින		

සභාපති,

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (SLSEA) 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පණතේ 13(1) වගන්තිය සහ 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ඇත.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරනයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳව ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2 මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි අධිකාරියෙන් පවරා ගත් අක්කර 50 ක භූමිභාගයක් සහිත ඉඩම සහ ඒ තුල ඉදිකර ඇති හම්බන්තොට සෝලා පාර්ක් ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේදී ද අගය කර මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ආ) සම්පූර්ණයෙන්ම විනාශ වූ සුලං කුලුණ ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් නොකිරීම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන දේපල පිරියත හා උපකරණ වල වටිනාකම රු.2,377,000 කින් වැඩිපුර දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන වලට අනුව හම්බන්තොට බල ජනනයෙන් ලද ආදායම රු.36,355,017 කි. කෙසේ වුවද, විකුණුම් ඉන්වොයිස් වලට අනුව එය රු.44,153,180 වූයෙන් 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන ආදායම සහ ලැබිය යුතු දෑ රු.7,798,163 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) පසුගිය වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කර තිබුණද, ඒ බව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 03, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි, අනුව හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු සහ ගෙවිය යුතු වටිනාකම් පිළිවෙලින් රු.15,872,896 සහ රු. 37,698,530 සම්බන්ධව වයස් විශ්ලේෂන පිළියෙල කර නොතිබුණි. තවද එකී ශේෂයන් සම්බන්ධව 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ තහවුරු කිරීම් කැඳවා නොතිබුණි. එම නිසා මෙම ශේෂයන් ගේ නිරවද්‍යතාවය සහ විශ්වාසනීයත්වය පිළිබඳ තහවුරුවක් විගණනයේ දී ලබා ගැනීමට නොහැකි විය.

2.2.3 නොසැසඳුණු වෙනස්කම්

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වටිනාකම සහ විගණනයට ලබාදුන් විස්තරාත්මක උපලේඛනයේ දැක්වෙන වටිනාකම අතර රු. 13,624,445 ක වෙනසක් දක්නට ලැබුණි.

(ආ) සුනිත්‍ය බලශක්ති අරමුදල සහ සුනිත්‍ය බලශක්ති භාරකාර අරමුදලට අදාල ශේෂ ඊට අනුරූපී ආයෝජන වටිනාකම් දෙක අතර පිළිවෙලින් රු. 8,030,813 සහ රු. 8,000,000 වෙනස්කම් නිරීක්ෂණය විය.

2.3 නීති,රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

විගණනයේදී හෙළිදරව් වූ නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) 1971 අංක 38 දරණ	
<u>මුදල් පනත</u>	
(i) 8(1) වගන්තිය	2012 සැප්තැම්බර් 30 දිනට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතු අධිකාරියේ 2013 වර්ෂය සඳහා වූ අයවැය 2013 ජනවාරි 16 දින අනුමත කර තිබුණි.
(ii) 14(1) වගන්තිය	සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) <u>භාණ්ඩාගාර චක්‍රලේඛ</u>

(i)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය	චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(ii)	2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/ 2002/02 දරණ චක්‍රලේඛය	පරිගණක දෘඩාංග හා මෘදුකාංග සඳහා ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ඇ)	මුදල් රෙගුලාසි අංක 396	රු. 459,910 වටිනා හිඟව ඇති චෙක්පත් පිළිබඳව නිසි පියවර ගෙන නොතිබුණි.

3. <u>මූල්‍ය සමාලෝචනය</u>

3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.44,490,201 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ රු.20,906,665 අතිරික්තයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.23,583,536 ක වර්ධනයක් දැක්වේ. පුනරාවර්තන ප්‍රදාන බලශක්ති බලපත්‍ර ගාස්තු සහ ඉන්ධන බල උත්පාදනයෙන් (ඉඳුරාන) ලැබූ ආදායම රු.51,503,137 කින් වැඩිවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.2 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

3.2.1 <u>ප්‍රොටෝටයිප් විදුලි වාහන 3 ක් (prototype Electric Vehicles) සංවර්ධනය කිරීම</u>

මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද පරිදි, ප්‍රොටෝටයිප් විදුලි වාහන තුනක් 2007 සැප්තැම්බර් 28 සිට මාස 18 ක් ඇතුළත සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 7.888 ක මුදලක් එනම් එකඟ වූ මිලෙන් සියයට 87.66 ක් 2009 දෙසැම්බර් 31 දිනට ගෙවා තිබුණි. විධිමත් කාල දීර්ඝ කිරීමක් නොමැති වූ ව්‍යාපෘති කාල.පරිච්ඡේදය වර්ෂ 4 කට ආසන්න කාලයක් වැඩිපුර ඇදී ගොස් තිබුණද, විගණන පරීක්ෂණ දිනය වූ 2013 මැයි මාසය දක්වා ද එක් වාහනයක් හෝ නිම කිරීමට සංවර්ධකට නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය.

3.2.2 <u>සුළං මනින කුඹ 10 ක් (Wind Measuring Masts)සැපයීම, පිරි සැකසීම ,සවිකිරීම හා පැවරීම</u>

මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් පහත දැක්වෙන දුර්වලතාවයන් 2014 මැයි මාසය අග වන විටත් නොවෙනස්ව පැවතුණි.

(අ) සුලං මනින දත්ත රැස් කිරීම පිළිබඳව භෞතික කාර්ය සාධනය සියයට 51 ක මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. එබැවින් සුලං මනින කුඹ ස්ථාපිත කිරීම සඳහා ස්ථාන හඳුනා ගැනීම, සුලං මැනීමේ දත්ත රැස් කිරීම හා එම දත්ත වාර්තාකරණය ආදී අපේක්ෂිත අරමුණු සුලං මනින කුඹ ස්ථාපිත කිරීම මඟින් ඉටුකර ගැනීමට අධිකාරියට නොහැකි වී තිබුණි.

(ආ) නාවු කුඩා හි සවි කරන ලද කුළුණ අවශ්‍ය ප්‍රමිතියට නොමැති වීම නිසා දරන ලද රු.2,377,000 ක පිරිවැය ඵල රහිත වියදමක් බවට පත්ව ඇති බව නිරීක්ෂණය විය.

3.2.3 "ස්විච් -ඒෂියා"වැඩ සටහන (switch –Asia programme)

මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වාදෙන ලද පරිදි "ස්විච් -ඒෂියා"වැඩ සටහන යටතේ ලැබුණු රු.7,334,354 ක මුදලින් රු.3,135,202 ක මුදලක්, 1994 ජූනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ හා 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ/5 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව 2010 හා 2011 වර්ෂ තුළදී අධිකාරියේ සියළු නිලධාරීන් සඳහා වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණි.

මෙම ගෙවීම සියළුම නිලධාරීන්ගෙන් හෝ අධිකාරියේ සභාපතිගෙන් අයකර ගැනීමට , විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් ඔහුගේ 2012 දෙසැම්බර් 03 දිනැති අංක පීඊ/අයිඒ/22/vol-II දරන ලිපියෙන් අධිකාරියේ සභාපති වෙත උපදෙස් දී තිබුණි. කෙසේ වුවද මෙම බලය නොලත් ගෙවීම් අයකර ගැනීම සඳහා විගණන පරීක්ෂණ දිනය වන 2014 මැයි 26 දක්වා අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය (HRM)

අධිකාරියේ විධිමත් කාර්ය මණ්ඩල කළමනාකරණයක් ක්‍රියාත්මක නොවූ අතර අධිකාරියේ වර්තමාන බඳවා ගැනීම් පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණි.

3.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදලේ හා ශ්‍රී ලංකා සුනිත්‍ය සහතික අරමුදලේ ආයෝජනයන්ගෙන් 2008 සිට 2012 කාල පරිච්ඡේදය දක්වා ලැබී තිබුණු රු. 39,618,010 ක් වූ පොළී ආදායම අදාළ අරමුදල්වලට ප්‍රේෂණය කිරීමෙන් තොරව අධිකාරිය විසින් උපයෝජනය කර තිබුණි.

3.5 <u>අධිකාරී බලය නොමැති ගෙවීම්</u>

අධිකාරිය විසින් සේවකයින්ගේ ලබා නොගත් නිවාඩු සඳහා වූ රු 1,038,866 ක මුදල, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂමේ විධිමත් අනුමැතියෙන් තොරව මුදල් කර තිබුණි.

3.6 <u>නිරවුල් නොකළ විදේශ ගමන් අත්තිකාරම්</u>

අධිකාරියේ අධ්‍යක්ෂවරයෙකු විසින් විදේශ පුහුණු වැඩ සටහනකට සහභාගී වීම සඳහා උණුසුම් ඇඳුම් මිලට ගැනීම සඳහා අත්තිකාරම් වශයෙන් රු.15,880 ක් සහ රු.116,991 ක් දෙවතාවකදී ලබාගෙන තිබුණි. කෙසේ වුවද විගණනය දිනය වූ 2014 මැයි 26 දින වන විටත් එකී අත්තිකාරම් පියවා නොතිබුණි.

4. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>අයවැය ලේඛනමය පාලනය</u>

සමාලෝචිත වර්ෂය සඳහා ඇයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

- (අ) අයවැය පාලනය
- (ආ) වත්කම් කළමනාකරණය
- (ඇ) ගිණුම්කරණය
- (ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- (ඉ) මානව සම්පත් කළමනාකරණය
- (ඊ) ගෙවීම් පරිපාටිය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

මගේ අංකය : SEA/IA/CH/14/02
2015.01.20

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72
පොල්දූව පාර
බත්තරමුල්ල

මහත්මයාණෙනි,

<u>ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>

උක්ත වාර්තාවට අදාල පිළිතුර මේ සමඟ ඉදිරිපත් කරමි.

ප්‍රසාද් ගල්හේන
සභාපති
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

පිටපත : 01. ආර්. එම්. රත්නායක මහතා - සහකාර විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව

2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(a) අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු ශ්‍රීලසුබඅ විසින් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අරම්භ කරන ලද අතර ඉඩමෙහි ඔප්පුව මහවැලි අධිකාරියෙන් ලැබෙන තුරු සිටී. ඔප්පුව ලැබුනු වහාම තක්සේරුවක් ලබා ගැනීම සඳහා සහ නියම වටිනාකම වත්කම් ලේඛනයට සහ ශේෂ පත්‍රයට ඇතුළත් කිරීම සඳහා පියවර ගනු ලැබේ. 2013 වර්ෂයේ ශේෂ පත්‍රයේ මෙය පාද සටහනක් ලෙස ඇතුලත් කර ඇති අතර ඉඩමේ සත්‍ය තක්සේරු වටිනාකම ලැබුනු විට නිවැරදි අගය ගිණුම්වල සඳහන් කරනු ලැබේ.

(b) මෙම අලාභය වාර්තාකරමින් F.R. 104 ඉල්ලුම්පත්‍රය අදාල ලිපිලේඛන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති F.R. 109 අනුමැතිය ලැබුනු පසු කපා හැරීම සඳහා පියවර ගනු ලැබේ.

(c) මුදල් පොත් ශේෂය සහ අවසන් ගිණුම් ශේෂය අතර මෙම වෙනස සිදු වී ඇත්තේ කෙටුම්පත් ගිණුම් ඉදිරිපත් කිරීමෙන් පසුව මුදල් පොතේ ඇතුලත් කිරීම් කිහිපයක් නිවැරදි කිරීම හේතුවෙනි. විගණන විමසුම සළකා බලමින් ඇතුලත් කිරීම්වල මෙම වෙනස මේ වනවිට නිවැරදි කර ඇති අතර නිවැරදි අගයන් අවසන් ප්‍රකාශනවල දක්වා ඇත.

(d) 2013 අවසන් ගිණුම්වල අනෙකුත් අදාල ආයෝජන සමඟ සමගාමීව ශ්‍රී ලංකා සුනිත්‍ය සහතිකවීමේ අරමුදලෙහි ආයෝජන වෙනම පෙන්වා ඇත.

(e) ඔබගේ විගණන නිරීක්ෂණයෙන් පෙන්වා දී ඇති අඩුවෙන් දක්වා ඇති දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ සඳහා හේතු වී ඇත්තේ WIP වෙතින් මාරු කරන ලද මුදල් ප්‍රමාණයයි. WIP හි ඇතුලත් කර ඇති මෙම ප්‍රමාණයන් වර්ෂය තුළදී අත්පත් කරගත් වත්කම් ලෙස සළකා නොමැත.

(f) හඳුනානොගත් මෙම තැන්පත් ලැබෙන්නේ අපගේ සේවාලාභීන් විසින් සෘජුව අපගේ බැංකු ගිණුම සිදු කරන තැන්පත් වලිනි. ඒවායින් බොහොමයක් මේ වනවිට හඳුනාගෙන ඇති අතර ගිණුම්වලට ගෙන ඇත.

(g) වරද නිවැරදි කිරීම සඳහා මේ වනවිටත් පියවර ගෙන ඇති අතර CFL ණය ශේෂය වර්තමානයේදී 2013 අවසන් ගිණුම්වල නිවැරදිව පෙන්වා ඇත.

(h) විගණකවරයාගේ මෙම නිරීක්ෂණය නිවැරදි වන අතර පිළිගනු ලැබේ. රු.මි. 6.9ක මෙම ප්‍රාග්ධන ප්‍රදානය වැරදීමකින් පුනරාවර්තන ප්‍රදාන යටතේ දක්වා ඇත. නමුත් මෙය මේ වනවිට 2013 වර්ෂයේ අවසන් ගිණුම්වල නිවැරදි කර ඇත.

(i) මෙය ඉහත (e) යටතේ පැහැදිලි කර ඇත.

(j) මොටර් වාහන ආරක්ෂණ පද්ධතිය (GPS) පුනරුත්ථාපනයක් ලෙස සළකන අතර ස්ථාවර වත්කම් වැඩිදියුණු කිරීම ප්‍රාග්ධන වියදමක් ලෙස සළකනු ලැබේ.

(k) සූර්ය පනේල සඳහා සහ බලශක්ති උපකරණ සඳහා ක්‍රමක්ෂය මේ වනවිට නිවැරදි කර ඇත. පරිගණකවල වෙනස වර්ෂය තුළ සිදු කරන ලද මිලදී ගැනීමකට අදාල නොවේ.

(l) ඉඩම් අත්පත් කර ගැනීමේ මෙම තැන්පතුවල ශුද්ධ ශේෂය මූල්‍ය ප්‍රකාශන අගය වේ. ඉඩම් අත්පත් කර ගැනීමේ මුදල් ප්‍රමාණයේ වෙනසට හේතු වී ඇත්තේ ආයෝජකයින් විසින් තැන්පත් කරන ලද මුදලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආදියට පසුව කරන ලද ගෙවීම්, තොරතුරු ලබාගත් මෙහෙයුම් අංශය විසින් ඇතුලත් කර නොතිබීමයි.

(m) මෙහෙයුම් අංශය සතුව පවතින තොරතුරු විදුලි බලය නිෂ්පාදනය කරන ලද මාසය පදනම් කරගත් ඒවා වේ. නමුත් ගිණුම් අංශය විසින් ඉන්වොයිසි දිනය පදනම් කර ගනිමින් ගිණුම්කරණ තොරතුරු නිවැරදිව තබා ගනු ලැබේ. එබැවින් මෙම වෙනස් ඇති වී ඇත.

2.2.2 ලැබිය යුතු දේ සහ ගෙවිය යුතු දේ

(a) විගණකවරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා 2013 වර්ෂයේ ලැබිය යුතු ගෙවීම්වල කාල විශ්ලේෂණයක් සකස් කිරීමට පියවර ගෙන ඇත.

(b) අමාත්‍යාංශය සඳහා රු.මි.8ක ණයක් 2013 වර්යේදී සම්පූර්ණයෙන් අප වෙත නිරවුල් කර ඇති බව නිරීක්ෂණය වී ඇති අතර අවසන් ගිණුම්වල නිවැරදි කර ඇති බලශක්ති අරමුදලෙන් ලබා ගත් ණය හා සම්බන්ධ මුදල් ප්‍රමාණය සඳහා මෙම ගනුදෙනුව නිවැරදිව ගිණුම්ගත කර ඇත.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

(a)
(b) } 2012 වර්ෂය සඳහා ගිණුම් ගැලපීම සඳහා වෙනස් කරන ලද ඇතුලත් කිරීම් හේතුවෙන් මෙම වෙනස්කම් ඇති වී ඇත.මෙම ගැලපීම් විගණනයට ප්‍රතිචාරයක් වශයෙන් සිදු කර ඇත.

2.3 <u>නීති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම</u>

(a) වර්ෂය සඳහා අයවැය සකස් කල හැකි වන්නේ අයවැය දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන වල උපරිම සීමාවන් ලැබීමෙන් පසුව පමණි. 2013 වර්ෂයේ අයවැය සිමාවන් ලැබුනේ 2012 වර්ෂයේ නොවැම්බර් මාසයේදීය. එබැවින් විගණන කෙටුම්පත් වාර්තාවේ පෙන්වා දී ඇති පරිදි වර්ෂය ආරම්භ වීමට මාස 3 කට පෙර අයවැය සකස් කර අනුමත කරගත නොහැක.

(b) සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ස්ථාවර වත්කම් ලේඛනය වර්ෂ ගණනාවක සිට නඩත්තු කරමින් පවතී. ඇති එකම අඩුපාඩුව වන්නේ නඩත්තු කරනු ලබන ඉන්වෙන්ටරි තොරතුරු විධිමත්ව කාණ්ඩගත කර නොමැති වීමයි. මෙම අයිතම කාණ්ඩගත කිරීම සඳහා සහ ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව නඩත්තු කිරීම සඳහා මේ වනවිට පියවර ගෙන ඇත.

(c) ස්ථාවර වත්කම් සඳහා පවත්වාගෙන යනු ලබන ඉහත ලේඛනයෙහි වෙනත් ස්ථානයක පරිගණක දෘඩාංග/මෘදුකාංග සඳහා ලේඛනයද පවත්වාගෙන යනු ලැබේ.

(d) F.R.396 අනුව කටයුතු කිරීම සඳහා මේ වනවිට පියවර ගෙන ඇත.

3 මූල්‍ය සමාලෝචනය

3.2 මූල්‍ය ප්‍රතිඵල

විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කර ඇත.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

3.3.2 මූලාකෘති විදුලි වාහන තුනක් සෑදීම

ඉහත ඉලක්කය භාරගත් සංවර්ධකයා 2013 නොවැම්බර් මස 25 වැනි දින රථ රාමුව සහ ධාවන කොටස නිම කිරීමට සමත් වූ අතර කෙටි පරීක්ෂණ ධාවනයක් ඉදිරිපත් කරන ලදී. මෙම සාක්ෂාත් කර ගැනීමේ වීඩියෝ ක්ලිපයක් <http://youtu.be/nrYFROJL25c> මඟින් නැරඹිය හැක. සංවර්ධකයා විසින් මේ වන විට රථ රාමුවට රථයේ බඳ සවිකිරීම මූල්‍ය අවහිරතා හේතුවෙන් අඩු වේගයකින් යුතුව සිදු කරගෙන යනු ලැබේ. ගිවිසුම කඩ කිරීම පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවට දැනුම් දීම මඟින් නීතිමය පියවර ගැනීම ආරම්භ කර ඇති අතර 2014 ජූලි මස 30 වැනි දින නීතිපති විසින් එය පිළිගෙන ඇත. (යොමුව C/154/14/SLSEA).

3.2.2. සුළං මැනීමේ කුළුණු 10ක් සැපයීම, එකලස් කිරීම, ස්ථාපිත කිරීම සහ කොමිෂන් කිරීම

ඉහත ප්‍රකාශය මදක් නිවැරදි වන අතර 2013 පෙබරවාරි මස 08 වැනි දිනට පමණක් සුළං-මැනුම් කුළුණු 3ක පමණක් දත්ත සැපයීමට අධිකාරියට හැකි විය. මෙයට හේතු වූයේ සුළං දත්ත මැනීම සඳහා යොදා ගත් මැනුම් උපකරණ සමහරක් ඒවායේ ක්‍රියාකාරී ජීව කාලය ඉක්මවීම සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව අධිකාරියට පැමිණෙන අවස්ථාවේදී දුරස්ථ ප්‍රවේශ පහසුකම මගින් ප්‍රවේශවීමට හැකිවූයේ සුළං මැනුම් කුළුණු 3කට පමණක් වීමයි. දුරස්ථ ප්‍රවේශය සහ දත්ත එක්රැස් කිරීම සුළං මැනුම් කුළුණු කිහිපයකට පමණක් සීමා වුවද, මෙම සුළං මැනුම් කුළුණුවල සත්‍ය තත්ත්වය නිරීක්ෂණය කිරීම සඳහාත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහාත් නිරන්තර වැඩපොළ සංචාර සහ අතින් සිදු කරනු ලබන දත්ත එක්රැස් කිරීම් පසුගිය වර්ෂ කිහිපයේදී සිදු කර ඇත. මෙම සුළං දත්ත අධිකාරියේ ප්‍රාදේශීය සුළං සම්පත් ඇගයීමවලට අමතරව සුළං ව්‍යාපෘති සංවර්ධකයින්ගේ භාවිතය සඳහාද පවතී.

මෙම ප්‍රකාශනය නිවැරදි වුවද වෙරළබඩ පරිසරයකදී සුළං මැනුම් කුළුණු සහ සම්බන්ධිත උපකරණවල ජීව කාලය වර්ෂ 2-3 ක් වන බව අපේක්ෂා කෙරේ. දිවයිනෙහි වෙරළබඩ තීරුවෙහි ස්ථානගත කර ඇති සුළං මැනුම් කුළුණු මේ වනවිටත් ඒවායේ අපේක්ෂිත ක්‍රියාකාරී ජීව කාලය කරා ළඟා වී ඇත. මෙම සුළං මැනුම් කුළුණු සඳහා ප්‍රධාන අළුත්වැඩියා කිරීම් සිදු කිරීමෙන් සහ උපකරණ අළුතින් යෙදීමෙන් තොරව සුළං මැනීමේ කටයුතු තවදුරටත් ඉදිරියට සිදු කරගෙන යෑමට නොහැක. තවද වර්ෂ 2ක දත්ත සුළං සම්පත් ඇගයීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් වන බව සළකන අතර මෙම සුළං මැනුම් කුළුණු බොහොමයකින් සෑහිමකට පත් විය හැකි මට්ටමේ සුළං දත්ත එක්රැස් කර ගැනීමට අධිකාරිය සමත් වී ඇත. තවදුරටත් මෙම මැනුම් කුළුණු භාවිතා කිරීමෙන් එක්රැස් කරගත් දත්ත සුළං ගතිලක්ෂණ, ව්‍යාප්තිය, කලාපීය සුළං බලශක්ති විභවයන් හඳුනාගැනීම සඳහා

යොදා ගෙන ඇති අතර සහ අවසානයේදී කලාපීය සුළං සම්පත් සිතියම් සකස් කිරීම සඳහා යොදා ගනු ලැබේ. මෙම දත්ත මෙම කලාපයන්හි සුළං බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහාද යොදා ගෙන ඇත. 2010 වර්ෂයේ සිට බොහොමයක් සුළං බලශක්ති ව්‍යාපෘති සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කරමින පවතින අතර 2014 මැයි මාසය වනවිට ස්ථාපනය කරන ලද මුළු සුළං බලශක්ති ධාරිතාවය මෙ.වො. 88.45කි. මෙම සුළං බලශක්ති සංවර්ධකයින්හට ඔවුන්ගේ ව්‍යාපෘති සිදු කරගෙන යෑම සඳහා මෙම සුළං මැනුම් කුළුණු දත්ත බෙහෙවින් ප්‍රයෝජනවත් විය.

අධිකාරිය මෙම ව්‍යාපෘතියෙන් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත අරමුණ වන්නේ පරිභෝජන මට්ටමේ විදුලිබල උත්පාදනය සහ ජාලයෙන් පිටත සුළං බලශක්ති යෙදවුම් සඳහා සුළං බලශක්තිය යොදා ගැනීම සඳහා සුළං බලශක්ති තාක්ෂණික ක්‍රමවේද භාවිතා කළ හැකි ප්‍රදේශ හඳුනාගැනීම සඳහා සහ ඔවුන්ගේ ව්‍යාපෘති සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා සුළං බලශක්ති ව්‍යාපෘති සංවර්ධකයින්හට බිම් මට්ටමේ සුළං දත්ත සැපයීමයි. එබැවින් අධිකාරිය බලාපොරොත්තු වූ අරමුණ සාර්ථකව සාක්ෂාත් කරගෙන ඇත.

(a) ආසියානු සංවර්ධන බැංකු වැඩසටහන වන "මන්නාරම් දිස්ත්‍රික්කයේ සුළං බලශක්ති සංවර්ධන ප්‍රධාන සැලැස්ම" සඳහා මීටර් 80 ක් උස නව සුළං මැනුම් කුළුණක් සිටුවීම සඳහා නාඩුකුඩා ප්‍රදේශයේ වසරක කාලයක සිට ක්‍රියාකාරීව පැවති මෙම කුළුණ ඉවත් කරන ලදී. මීටර් 50ක් උස පැරණි සුළං මැනුම් කුළුණ සහ සම්බන්ධිත උපකරණ (රුකුල් කම්බි ඇතුළුව) විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විමර්ශනය සඳහා ඉදිරිපත් කළ හැක.

අධිකාරියේ සුළං කුළුණ ක්‍රියාකාරීව පැවති මෙම වර්ෂයක කාලයේදී, මෙම ස්ථානය සුළං බලශක්ති ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා විශිෂ්ට ස්ථානයක් බව හඳුනාගත හැකි විය. එබැවින් මෙම සුළං මැනුම් කුළුණ ඉවත් කරන ලද අතර වඩාත් විස්තීර්ණ සුළං මැනීමේ වැඩසටහනක් සඳහා (ඉහත සඳහන් කරන ලද වැඩසටහන) විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය යටතේ මෙම අති නවීන මීටර් 80ක් උසැති සුළං මැනුම් කුළුණ ස්ථාපිත කිරීම සඳහා එම ස්ථානය යොදා ගන්නා ලදී.

කලාපීය සුළං රටා හඳුනාගැනීම සඳහා වන ADB අධ්‍යයනයට මීටර් 80 සුළං මැනුම් කුළුණෙහි දත්ත භාවිතා කරන ලදී. මෙම වැඩසටහන යටතේ මන්නාරම් දූපත සහ අවට කලාපය සඳහා සවිස්තර සුළං සම්පත් සිතියමක් මේ වනවිටත් සකස් කර ඇත. මෙම අධ්‍යනයේ ප්‍රතිඵලයක් ලෙස කලාපයේ මුළු සුළං බලශක්ති ව්‍යාපෘති සංවර්ධන ධාරිතාවය මෙ.වො.375ක් බව හඳුනාගන්නා ලදී. ඇස්තමේන්තුගත මෙම විභවයෙන් මෙ.වො.100ක් ආරම්භයේදී සුළං උද්‍යාන සංකල්පයක් ලෙස සංවර්ධනය කළ හැකි බව වාර්තා වී ඇත. ඉහත ADB වැඩසටහන සඳහා ක්‍රියාවට නැංවීමේ අධිකාරිය ලෙස සුනිත්‍ය බලශක්ති අධිකාරියට මෙම නව සුළං මැනුම් කුළුණේ දත්ත සඳහා සහ එහි සොයාගැනීම් සඳහා ප්‍රවේශක් පවතී. මෙම දත්ත අනාගතයේදී සුළං බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය ක්‍රියාකාරකම් සඳහා යොදා ගනු ඇත.

3.2.3. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම

ශ්‍රීලසුබඅ පනතේ 30 වැනි වගන්තියට අනුව, රජයේ කාර්යයක් (පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය ඇතුළුව) ලෙස අධිකාරිය සළකනු ලබන කිසියම් කාර්යයක් සඳහා අධිකාරියට අවශ්‍ය ඉඩමක් ඉඩම් අත්පත් කර ගැනීමේ පනත අනුව අත්පත් කරගත හැක. පසුගිය අත්දැකීම් පදනම් කර ගනිමින් මෙම ක්‍රියාවලිය සඳහා අවම වශයෙන් සති 72ක කාලයක් ගත වන බව සඳහන් කළ හැක. ආයතන කිහිපයක් සම්බන්ධ වන අතර අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය මෙම ආයතනවල එනම් ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය, පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, තක්සේරු දෙපාර්තමේන්තුව, ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව ආදියෙහි දායකත්වය මත රඳා පවතී.

ඉඩම් අත්පත් කර ගැනීම සඳහා මුදල් තැන්පත් කර ඇති ව්‍යාපෘති 11න්, ඉඩම් හිමියන්ගෙන් ඉඩම් මිලදී ගත් සංවර්ධකයින්ගේ ඉල්ලීම මත 03ක් ඉවත් කරන ලදී. වෙනත් ව්‍යාපෘති 03ක තවදුරටත් ඉඩම් අත්පත් කරගත යුතුදැයි ශ්‍රීලසුබඅ විසින් සංවර්ධකයින්ගෙන් විමසීමක් කර ඇති අතර ඔවුන්ගේ ප්‍රතිචාරය ලැබෙන තෙක් සිටී. අනෙකුත් ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

3.2.4. ස්විච්-ඒෂියා වැඩසටහන

මේ සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ උපදේශය වූයේ ලේකම්වරයා විසින් ලබා දී ඇති උපදෙස් අනුව ක්‍රියාකිරීම මෙන්ම කාරණය සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සහ ලේකම්වරයා සමඟ සාකච්ඡා කර සුහද විසඳුමකට පැමිණෙන ලෙසත්ය. ඒ මත පදනම්ව කාරණය සම්බන්ධ ක්‍රියාකාරකම් සිදු කරන ලද අතර විස්තර පහත දක්වා ඇත.

කාරණය සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරය 2012.12.05 දිනැති ලිපිය මඟින් විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාට දන්වා ඇති අතර විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා භාණ්ඩාගාර ලේකම්වරයා වෙත යවන ලද 2013 ජනවාරි 24 දිනැති ලිපිය මගින් භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලා ඇත. එයට සමගාමීව, ශ්‍රීලසුබඅ පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ විෂය පථයට යටතට පත් වීමෙන් පසු අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් ලබාගැනීමෙන් පසු අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාරය අමතා ලිපියක් යවා ඇත. තවදුරටත් පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා භාණ්ඩාගාරයට සහ විගණකාධිපතිවරයාට පිටපත් සහිතව තත්ත්වය සම්පූර්ණයෙන් පැහැදිලි කරමින් 2014.12.02 වැනි දින COPE ලේකම්වරයාට ලිපියක් යවා ඇත.

3.4 මානව සම්පත් කළමනාකරණය (HRM)

සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් (DMS) අනුමැතිය ලැබුනු වහාම බඳවා ගැනීමේ පටිපාටියක් (SOR) සැකසීම සඳහා පියවර ගනු ලැබේ.

3.5 විවාදයට ලක් විය හැකි ආකාරයේ ගනුදෙනු

භාණ්ඩාගාරයෙන් ලැබෙන අග්‍රිම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සහතිකවීමේ අරමුදලේ පොළියෙන් කිසියම් ප්‍රමාණයක් ශ්‍රීලසුබඅ වියදම් පියවා ගැනීම සඳහා භාවිතා කිරීමට අධිකාරියට සිදු වී ඇත. කෙසේවෙතත්, මේ සම්බන්ධයෙන් ශ්‍රීලසුබඅ යේ ඉහළ කළමනාකාරිත්වය විසින් අනාගතයේදී නැවත සළකා බලනු ඇත.

3.6 අනවසර ගෙවීම්

2013.07.30 දිනැති SEA 23 දරන 23/2013 පත්‍රිකාවේ මණ්ඩල අනුමැතියට අනුව ගෙවීම සිදු කර ඇත.අධ්‍යක්ෂ මණ්ඩල මඟපෙන්වීම අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් සහ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් අනුමැතිය ඉල්ලා 2013.08.29 වැනි දින ඉල්ලීමේ ලිපියක් යවා ඇත. 2013.12.30 දින ලැබුනු DMS පිළිතුරු ලිපිය අනුව මෙම ගෙවීම සඳහා සභාපතිවරයා විසින් ඔහුගේ අනුමැතිය ලබා දී ඇත. මෙම යෝජනාක්‍රමය ප්‍රධාන වශයෙන් සේවකයින් අභිප්‍රේරණය කිරීම අරමුණු කර ගනිමින් හඳුන්වාදෙන ලදී.

3.7 නිරවුල් නොකළ විදේශ අත්තිකාරම්

මුදල් රෙගුලාසි අනුව උණුසුම් ඇඳුම් සඳහා වන මෙම අත්තිකාරම් සත්‍ය කාරණය සඳහා මුදල් වියදම් කරන ලද බව සඳහන් කර ලිපියක් ඉදිරිපත් කිරීමෙන් නිරවුල් කළ හැක. එවැනි ලිපියක් එම සේවකයා විසින් ඉදිරිපත් කර නොමැති අතර ඔහු තවදුරටත් මෙ කාර්යයාලයේ සේවය නොකරයි. මෙම අත්තිකාරම් නිරවුල් කරන මෙන් දන්වා ඔහුට සිහිකැඳවීමේ ලිපියක් යවා ඇත.